79 අප්‍රේ 19

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 2.10 යි　　　තැපැල් ගාස්තුව : රු. 1.00 යි

# 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]
එල්. ඩී.—ඕ. 13/78.

**ජාතික නිවාස සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එහි බලතල හා කාර්ය විධිමත් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

## I වන කොටස

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යනුවෙන් නම් කරනු ලබන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. *ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීම.*

(2) අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර එහි සංස්ථා නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම සහ ඒ නාමයෙන් අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ විය යුතු ය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව ශාඛා කාර්යාල පිහිටුවීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

3. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන්— *අධිකාරියේ සාමාජිකයෝ.*

(අ) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනකුගෙන් ; සහ

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන (මෙහි මින් මතු "නිලබලයෙන් සාමාජිකයා") යනුවෙන් සඳහන් කරනු ලබන එක සාමාජිකයකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) පත්කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හෝ කටයුතු කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි අතර ඒ විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ යුතුකම විය යුතු ය.

2—ඒ 38832—11,800 (79/01)

(4) මේ පනතේ III වන කොටසේ විධිවිධාන අධිකාරියේ සාමාජිකයන්ට අදාළ විය යුතු ය.

අධිකාරියේ අරමුණු.

4. අධිකාරියේ අරමුණු—

(අ) මහල් නිවාස, නිවාස සහ වෙනත් වාසස්ථාන හෝ ගොඩ නැගිලි ඉදිකිරීමෙහි ලා කෙළින්ම නියුක්ත වීම ;

(ආ) නිවාස හිඟය අඩු කිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලැස්මවල් සකස් කිරීම ;

(ඇ) මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත් කිරීමේ සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීමේ කටයුතු සැලැස්වීම ;

(ඈ) නිවාස සංවර්ධනයට රුකුල් දීම ;

(ඉ) අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම ;

(ඊ) නිවාස සංවර්ධනය සඳහා යම් තැනැත්තකුට ඉඩම් ලබාදීම ;

(උ) අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමාන වන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනැත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම ;

(ඌ) නිවාස සංවර්ධනයෙහි සියලු අංශවලට අදාළ වන ක්‍රියාකාර කම්වල නිරතවීම, ඒවාට අනුබල දීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ; සහ

(එ) ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියලු ක්‍රියා කිරීම

විය යුතු ය.

අධිකාරියේ බලතල හා කාර්ය.

5. (අ) (i) නේවාසික කාර්යයන් සඳහා යම් මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් හෝ යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම, වෙනස් කිරීම, වර්ධනය කිරීම සහ දීර්ඝ කිරීම සඳහා ;

(ii) ඒ මහල් නිවාසය, නිවාසය හෝ වෙනත් වාසස්ථානය හෝ ගොඩනැගිල්ල විකිණීම, බදු දීම, උකස් කිරීම හෝ කුලියට දීම සඳහා ;

(iii) මුඩුක්කු, පැල්පත්, ගෙපත් හා තදබද වූ, අවලක්ෂණ වූ හෝ සෞඛ්‍යයට අහිතකර වූ වෙනත් ගොඩනැගිලි ඉවත් කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා ;

(iv) අධිකාරියේ යම් ක්‍රියාවකින් පදිංචිය අහිමි වූ හෝ පදිංචිය අහිමිවිය හැකි තැනැත්තන් නැවත පදිංචි කරවීම සඳහා

යෝජනා, සැලසුම් සහ ව්‍යාපෘති පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(ආ) අධිකාරිය වෙත සතුකරනු ලැබූ හෝ අධිකාරියට අයත් සියලු ඉඩම්, මහල් නිවාස, නිවාස, වෙනත් වාසස්ථාන සහ ගොඩනැගිලි හෝ වෙනත් දේපළ ද කළමනාකරණය කිරීම ;

(ඇ) (i) මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන මිලට ගැනීමට ;

(ii) මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන ඉදි කිරීම සඳහා ඉඩම් මිලට ගැනීමට ; සහ

(iii) මහල් නිවාස, නිවාස හා වෙනත් වාසස්ථාන ඉදි කිරීමට

තැනැත්තන්ට හැකි කරවනු පිණිස නියම කරනු ලබන නියම හා කොන්දේසි මත ණය සැපයීම ;

(ඈ) අධිකාරියේ කාර්ය හා කටයුතු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහ සමීක්ෂණ පැවැත්වීම ;

(ඉ) නව නිවාස වතු පිහිටුවීම සහ ස්වයං ආධාර නිවාස ව්‍යාපෘති වලට අනුබල දීම සහ ප්‍රවාහණ හා වෙනත් සේවාවන් ඇතුළත්ව ඒ වතුවල හෝ ව්‍යාපෘතිවල පදිංචිකරුවන් සඳහා පහසුකම් සැලැස්වීම ;

(ඊ) කෙළින් ම හෝ රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ යම් අනුයෝජිතයකු හෝ මගින් අධිකාරියේ අරමුණු අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන සියලු ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ඉටු කිරීම ;

(උ) මුදලින් හෝ අන්‍යාකාරයකින් වූ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර භාර ගැනීම සහ අධිකාරියේ පරමාර්ථ අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඒවා යොදා ගැනීම ;

(ඌ) අධිකාරිය විසින් අත්කර ගනු ලැබූ හෝ දරනු ලබන යම් නිශ්චල දේපළක් සංවර්ධනය කිරීම ;

(එ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, ලබා ගැනීම හෝ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඒ) අධිකාරියේ පරමාර්ථ අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියමයන් හා කොන්දේසිවලට යටත්ව ණය ලබා ගැනීම ;

(ඔ) අධිකාරිය විසින් සපයා දෙනු ලැබූ යම් මහල් නිවාසයක්, නිවාසයක්, වෙනත් වාසස්ථානයක් හෝ යම් ගොඩනැගිල්ලක් සඳහා කුලිය අය කිරීම ;

(ඕ) අධිකාරිය විසින් සලස්වා දෙනු ලැබූ යම් සේවාවන් හා පහසුකම් හෝ සඳහා ගාස්තු අය කිරීම ;

(ක) ස්වකීය අරමුණු අතුරින් කිසිවක් මුදුන්පත් කර ගැනීම පිණිස අධිකාරියේ මතය අනුව අවශ්‍ය වන යම් ක්‍රියාකාර කමක් භාර ගැනීම ; සහ

(ග) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය ඉටු කිරීමට හා කටයුතු කිරීමට ප්‍රාසංගික හෝ ආනුෂංගික වන සියලු ක්‍රියා හෝ දේවල් කිරීම

අධිකාරියේ බලතල හා කාර්ය විය යුතු ය.

## II වන කොටස

### නිශ්චල දේපළ අත්කර ගැනීම සහ අධිකාරියට අයත් ඉඩම්, මහල් නිවාස, නිවාස සහ වෙනත් වාසස්ථාන විකිණීම

අනිවාර්යයෙන් ඉඩම් අත් කර ගැනීම.

6. (1) නිවාස තැනීමේ යම් අරමුණක් ක්‍රියාවේ යෙදවීම පිණිස ලබා දීමට රජයේ ඉඩමක් නොවන යම් ඉඩමක්, ආණ්ඩුවට අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සහතික කරන ලදුව, ඒ සහතිකය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම අත් කර ගනු ලැබ ඒ අධිකාරියට හෝ යම් පනතේ විධිවිධාන යටතේ බැහැර කරනු ලැබීමෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ ඒ කාර්යය සඳහා ඒ ඉඩම ලබා දිය හැකි ය.

(2) එවැනි යම් අත් කර ගැනීමක් සම්බන්ධයෙන් වූ විට, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව අත් කර ගැනීමේ අදහස පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම ඉඩම් අත් කර ගැනීමේ පනතින් නියමිත පරිදි නියමිත දිනයෙහි ආරම්භ වන තුන් අවුරුදු කාලසීමාවක් ඇතුළත යම් අවස්ථාවක පළ කරනු ලැබූ විට, ඉඩම් අත් කර ගැනීමේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව පිළිබඳව ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවයේ වෙළෙඳ අගය 1977 ජූලි මස විසිදෙවෙනි දිනට පසු ඒ ඉඩමට කරන ලද වැඩිදියුණු කිරීම් කිසිවක් වේතොත් ඒ වෙනුවෙන් සාධාරණ මුදලකින් වැඩි කරනු ලැබූ එදින වන විට ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවයේ වෙළෙඳ අගය ලෙස සලකනු ලැබිය යුතු ය.

චංචල වූ ද නිශ්චල වූ ද වර්ගයේ ම රජයේ දේපළ අධිකාරියට ලබාදිය හැකි බව.

7. (1) රජයේ යම් නිශ්චල දේපළක් අධිකාරියේ කාර්ය අතුරෙන් යම් කාර්යයක් සඳහා අධිකාරියට ලබාදීම අවශ්‍යව ඇති අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් අධිකාරිය වෙත කරනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන ඒ කාර්යය සඳහා ඒ දේපළ පිළිබඳව අධිකාරියට කරනු ලැබූ විශේෂ ප්‍රදානය කට හෝ බදු දීමකට අදාළ විය යුතු ය.

(2) රජයේ දෙපාර්තමේන්තුවක හෝ යම් රාජ්‍ය සංස්ථාවක යම් චංචල දේපළක් අධිකාරියේ කාර්ය සඳහා අවශ්‍ය වී ඇති අවස්ථාවක ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය අධිකාරියට පැවරීම හා අධිකාරිය වෙත සතු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ යම් දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක යම් චංචල දේපළක් කෙරෙහි බලපාන්නා වූ කිසිම නියමයක් ඒ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

ඉඩමක්, මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් අන්සතු කිරීමේ අයිතිය.

8. (1) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද බැහැර කිරීමේ සාධන පත්‍රයෙහි සඳහන් කරනු ලබන්නා වූ ද නියම හා කොන්දේසිවලට යටත් ව ද, ඒ සාධන පත්‍රයෙහි සඳහන් වෙනත් යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් හෝ ඒ සාධන පත්‍රය යටතේ අධිකාරියට ලැබිය යුතු යම් මුදලක් එහිලා සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත නොගෙවා ඉතිරි වුවහොත් හෝ ඒ සාධන පත්‍රය මගින් ඇති කරනු ලැබූ බැහැර කිරීම අවලංගු කරනු ලැබිය හැකි බවට හෝ අවසන් කරනු ලැබිය හැකි බවට වූ විශේෂ කොන්දේසියකට ද යටත්ව, එහෙත් මේ වගන්තියේ පනත සඳහන් විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක්, මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් විකිණීමක්, බදු දීමක්, කුලියට දීමක් හෝ කුලී සින්නක්කරයක් මගින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් බැහැර කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් දරනු ලබන යම් රජයේ ඉඩමක් අධිකාරියේ කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා බැහැර කිරීම කෙරෙහි රජයේ ඉඩම් ආඥාපනතේ සඳහන් කිසිවක් බල නොපෑ යුතු ය; නැතහොත් බලපාන ලෙස සලකනු නොලැබිය යුතු ය; නැතහොත් බලපාන ලෙස තේරුම් නොගත යුතු ය.

මිලට ගැනීම සම්බන්ධයෙන් වූ සීමා කිරීම.

9. එවැනි යම් කාර්යයක් සඳහා මේ කොටසෙහි විධිවිධාන යටතේ විකුණනු ලැබූ එක් නිවාසයකට, මහල් නිවාසයකට හෝ වෙනත් වාසස්ථානයකට හෝ යම් ඉඩමකට වැඩියෙන් මිලට ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකම් නොලැබිය යුතු ය.

මහල් නිවාස, නිවාස, වෙනත් වාසස්ථාන හෝ ඉඩම් සම්බන්ධයෙන් වූ ගම්‍යමාන කොන්දේසිය.

10. (1) අධිකාරිය විසින් යම් තැනැත්තකුට විකුණනු ලැබූ කිසිම මහල් නිවාසයක්, නිවාසයක් හෝ වෙනත් වාසස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි තැනිය හැකි යම් ඉඩමක් විකිණීමෙන් පසු අවුරුදු දහයක කාලසීමාවක් ඇතුළත අධිකාරියේ ලිඛිත කැමැත්ත නැතිව, දරුවකුට, මවකට හෝ පියකුට හෝ අඹු සැමියකුට ත්‍යාගයක් වශයෙන් හැර වෙනත් යම් ආකාරයකින් විකිණීම, බදු දීම, උකස් කිරීම හෝ බැහැර කිරීම ඒ තැනැත්තා විසින් කරනු නො ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් ලියා අත්සන් කරනු ලබන්නා වූ ද එවැනි මහල් නිවාසයක්, නිවාසයක්, වෙනත් වාසස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් පිළිබඳ වූ ද විකිණීමක්, බදු දීමක්, උකස් කිරීමක් හෝ වෙනත් යම් බැහැර කිරීමක් ශුන්‍ය හා බලරහිත විය යුතු අතර නීතිය අනුව කිසිම බලයක් හෝ බලපෑමක් එහි නොතිබිය යුතු ය.

(3) අධිකාරිය විසින් විකුණනු ලැබ ඇති යම් මහල් නිවාසයක, නිවාසයක, වෙනත් වාසස්ථානයක හෝ ගොඩනැගිල්ලක හෝ යම් ඉඩමක් හෝ ණයක් සඳහා ඇප වශයෙන් හිමිකම් ඔප්පු තැන්පත් කිරීමෙන් වූ කිසිම කැප අයිතියක් යම් තැනැත්තකුගේ වාසියට ඇති කරනු ලැබිය නොහැකි විය යුතු අතර, තැන්පත් කිරීමෙන් වූ එවැනි යම් කැප අයිතියක් සනාථ කිරීම් වශයෙන් වූ කිසිම කේවියට් තහනමක් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ නොහැකි විය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ වාසියට හෝ සාමාන්‍යාධිකාරිවරයාගේ වාසියට වූ තීන්දු ප්‍රකාශයක් හැර යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමෙහි දී එවැනි කිසිම මහල් නිවාසයක්, නිවාසයක්, වාසස්ථානයක්, ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් තහනමට නොගත යුතු ය.

සාධන පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් නඩුවක් පැවරිය නොහැකි විය යුතු බව.

**11.** වෙනත් යම් නීතියක විධිවිධානයන්හි පටහැනිව කුමක් සඳහන් වුව ද, 8 වන වගන්තියේ විධිවිධාන යටතේ අන් සතු කිරීමේ සාධන පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව හෝ අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

## III වන කොටස

## අධිකාරියේ සාමාජිකයෝ

සාමාජිකත්වයට නුසුදුසුවීම.

**12.** යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටී නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්වන්නේ නම් ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු ලෙස නොකඩවා ධුරය දැරීමට සුදුසු නොවිය යුතු ය.

අධිකාරියේ පත්කළ සාමාජිකයන් ඉල්ලා අස්වීම.

**13.** යම් පත් කළ සාමාජිකයකුට, තමා අධිකාරියෙන් අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් අධිකාරියෙන් ඉල්ලා අස්විය හැකි ය.

පත්කළ සාමාජිකයකු ඉවත් කිරීමට අමාත්‍යවරයා සතු බලතල.

**14.** අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයක් මගින්, යම් පත් කළ සාමාජිකයකු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම සම්බන්ධයෙන් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ යම් සාමාජිකයකු පිළිබඳව නියමයක් කරනු ලැබේ ද ඒ සාමාජිකයා ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි ධුරය හිස් කොට ඇතැයි සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයකුගේ ධුර කාලය.

**15.** (1) 13 වන සහ 14 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව පත් කළ සාමාජිකයකු තම ධුරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු ය :

එසේ වුව ද මිය යන්නා වූ හෝ ඉල්ලා අස්වන්නා වූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරන්නා වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු, කලින් ධුරය අත්හරින්නේ නම් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(2) රෝගාතුර වීම නිසා හෝ දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින නිසා හෝ තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා හෝ වෙනත් යම් පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට වෙනත් යම් සාමාජිකයකු හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

16. 14 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නොවන යම් පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය. සාමාජිකයන් වශයෙන් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම්.

17. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන්, අධිකාරියේ අරමුදලින් සියලුම සාමාජිකයන්ට හෝ ඔවුන් අතුරින් කිසිවකුට හෝ ගෙවනු ලැබිය හැකි ය. සාමාජිකයාගේ පාරිශ්‍රමිකය.

18. (1) අධිකාරියේ සභාපතිවරයාගේ ධුර කාලය අධිකාරියෙහි ඔහුගේ සාමාජිකත්වයේ කාලසීමාව විය යුතු ය. සභාපතිවරයාගේ ධුර කාලය.

(2) සභාපතිවරයා වශයෙන් වූ තම ධුරයෙන් ඉල්ලා අස්වීම සඳහා අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් සභාපතිවරයාට, සභාපති ධුරයෙන් කලින් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් යම් අවස්ථාවක දී හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසන් කළ හැකි ය.

19. (1) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, සාමාජිකයන් තුන් දෙනකු විය යුතු අතර, අධිකාරියේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල කටයුතු කිරීම ද අධිකාරිය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය. ගණපූරණය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාවල සමානත්වයක් ඇති වුවහොත් ඒ රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

20. අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලැබීමට යෝජනා කොට ඇති යම් ව්‍යාපාරික කටයුත්තක් පිළිබඳව කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින්, ඒ සම්බන්ධතාව ගැන සාකච්ඡා කරනු ලබන අධිකාරියේ රැස්වීමේ දී, ඒ සම්බන්ධතාවයේ ස්වභාවය එළිදරව් කළ යුතු ය. ඒ එළිදරව් කිරීම අධිකාරියේ වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ව්‍යාපාරික කටයුත්තට අදාළව සාමාජිකයා විසින් සම්බන්ධතාව අධිකාරියට එළිදරව් කළ යුතු බව.

අධිකාරිය විසින් පවත්වනු ලබන යම් විචාරණයක දී හෝ තීරණය කට එළඹීමේ දී ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතු අතර, ඒ විචාරණය පැවැත්වෙන අතරතුර හෝ ඒ තීරණයට එළඹෙන අතර තුර ඒ සාමාජිකයා ඒ රැස්වීම්වලින් ඉවත්ව යා යුතු ය.

පුරප්පාඩුව හේතුකොට ගෙන ක්‍රියා නිර්බල නොවිය යුතු බව.

21. ස්වකීය සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම පමණක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා දෝෂ කිසිවක් තිබීම පමණක් හෝ හේතු කොටගෙන අධිකාරියේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

22. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ රැකවරණයෙහි තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් අධිකාරි යේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස අධිකාරි යේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි තම අත්සන් යෙදිය යුතු ය.

## IV වන කොටස

## අධිකාරියේ නිලධරයෝ සහ සේවකයෝ

අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයා.

23. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සාමාන්‍යාධිකාරීවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) සාමාන්‍යාධිකාරීවරයාගේ පත්වීම අවසන් කිරීම අවශ්‍ය යයි අධිකාරිය සලකන්නේ නම්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධි කාරිය විසින් ඕනෑම අවස්ථාවක එසේ කළ හැකි ය.

(3) සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව අධිකාරියේ කටයුතු මෙහෙයවීම, අධිකාරියේ බලතල, කාර්ය හා කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාවේ යෙදීම සහ අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනමය පාලනය සාමාන්‍යාධිකාරීවරයා වෙත භාර කරනු ලැබිය යුතු ය.

(4) ස්වකීය බලතල, කාර්ය හෝ කටයුතු අතුරින් තමා විසින් අවශ්‍ය යයි කලින් කල සලකනු ලබන්නා වූ බලතල, කාර්ය හෝ කටයුතු අධිකාරියේ අනුමතය ඇතිව සාමාන්‍යාධිකාරීවරයා විසින් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි ය. තව ද එවැනි යම් බලතල, කාර්ය හෝ කටයුතු පවරනු ලබන්නා වූ යම් සේවා නියුක්තයකු විසින්, සාමාන්‍යාධිකාරීවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, එකී බලතල, කාර්ය හෝ කටයුතු ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

24. (1) ස්වකීය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන්නා වූ නිලධරයන් හා සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය. නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට, අධිකාරිය විසින් සාදනු ලැබූ රීති මගින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර ඔවුන් එම රීති මගින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ද කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාල සීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවයෙහි හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව අධිකාරිය සහ පළාත් පාලන සේවය හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් ගිවිස ගනු ලැබිය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි පිට අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය අනුව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

## V වන කොටස

### මුදල්

අධිකාරියේ අරමුදල.

25. (1) අධිකාරියට, අධිකාරියේම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) අධිකාරියේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර වූ හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ඈ) යම් රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් අධිකාරියට පවරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ද වේ.

(2) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් සඳහා ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.

(3) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂ පනහක් විය යුතු ය. අධිකාරියේ ප්‍රාග්ධන ප්‍රමාණය, අමාත්‍යවරයා විමසීමෙන් පසුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ වාරිකයන්ගෙන් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට ඒ මුදල් ප්‍රමාණයන් බැර කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, අධිකාරියේ ප්‍රාග්ධනය, විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් හෝ බලය දෙනු ලබන මුදල් ප්‍රමාණයන්ගෙන් කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර ඒ මුදල් ප්‍රමාණයන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමයන් හා කොන්දේසි පිට ආධාර වශයෙන් හෝ ණය වශයෙන් අධිකාරියට දෙනු ලැබිය යුතු ය; නැතහොත් අධිකාරියට ලබාගත හැකි විය යුතු ය.

අධිකාරිය සතු ණය ගැනීමේ බලතල.

26. (1) අධිකාරිය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වයෙන් අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමතය ඇතිව හෝ එබඳු අනුමතයක් ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලැබූ යම් සාමාන්‍ය බලයක් අනුව හෝ, අධිකාරියේ බැදීම් ඉටු කිරීම සඳහා හෝ මේ

පනත යටතේ ස්වකීය කටයුතු හා කාර්යයන් කිරීම සඳහා හෝ අධිකාරියට අවශ්‍ය වන්නා වූ මුදල් ප්‍රමාණයන්, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් තාවකාලිකව ණයට ගත හැකි ය:

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ අධිකාරිය විසින් ලබා ගන්නා ලද තාවකාලික ණය මුදල් කිසිවක් සම්බන්ධයෙන් ගෙවීමට තිබෙන මුදල්වල එකතුව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලකට වඩා කවර අවස්ථාවකදීවත් වැඩි නොවිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලැබූ අනුමතය ඇතිව, අධිකාරිය විසින්, (1) වන උපවගන්තිය යටතේ වූ තාවකාලික ණය වශයෙන් හැර අන්‍යාකාරයකින් ණය පත්‍ර නිකුත් කිරීමෙන් මුදල් ණයට ගත හැකි අතර, එසේ ඇති කරන ලදුව නිකුත් කරනු ලබන ණය පත්‍ර "ජාතික නිවාස සංවර්ධන අධිකාරී ණය පත්‍ර" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(3) ජාතික නිවාස සංවර්ධන අධිකාරී ණය පත්‍ර නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, නිදහස් කිරීම සහ අවලංගු කිරීම මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලැබූ අනුමතය ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි අනුව කරනු ලැබිය යුතු ය.

27. (1) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ ණය පත්‍ර මත අය විය යුතු යම් මුදලක මුල් මුදල ආපසු ගෙවීම සහ ඒ මුදල මත වූ පොලිය ගෙවීම සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා ඇප විය යුතු ය. ආණ්ඩුව ඇපවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සලස්වනු ලැබූ ඇපවීමක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන් යම් මුදලක්, පාර්ලිමේන්තුවේ පූර්ව අනුමතය ඇතිව, ඒකාබද්ධ අරමුදලින් ගෙවිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සලස්වනු ලැබූ ඇපවීමක් ඉටු කරමින් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබූ යම් මුදලක් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව, ඒ මුදල සඳහා වූ පොලිය ද සහිතව, ඒ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් සහ කාල සීමාවක් ඇතුළත අධිකාරිය විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඇපවීමක් කරනු ලැබූ විගසම, ඒ ඇපවීම පිළිබඳ ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සලස්වනු ලැබූ ඇපවීමක් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ මුදල එසේ ගෙවනු ලැබූ බව කියැවෙන ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අප්‍රමාදව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

ජාතික නිවාස අරමුදලෙහි වත්කම් හා බැරකම් අධිකාරිය වෙත පැවරීම.

28. (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනතේ 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද්දා වූ ද පැවරීමේ දිනයෙහි පවත්නා වූ ද ජාතික නිවාස අරමුදලෙහි යම් වත්කම් හා බැරකම් අධිකාරියේ අරමුදල වෙත පැවරීම සඳහා ද එම අරමුදලට සතු කිරීම සඳහා ද මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මණින් අමාත්‍යවරයා විසින්, නියමයක් මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතෙහි විධිවිධාන අදාල වීම.

29. (1) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ මුදල් පාලනයට අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

## VI වන කොටස

### ණය මුදල්වලට අදාළ විධිවිධාන

ණය මුදල යොදා ගනු ලබන කාර්යයන් විමර්ශනය කිරීමට අධිකාරිය සතු බලය.

30. අධිකාරිය විසින් ණයක් ප්‍රදානය කරනු ලැබ ඇති හෝ ප්‍රදානය කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ ණය ප්‍රදානය කර ඇත්තේ හෝ ප්‍රදානය කරනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා ඒ ණය යොදා ඇති බවට හෝ යොදවනු ලබන බවට අධිකාරිය සෑහිමට පත් කරවන ලෙස අධිකාරිය විසින් ඒ තැනැත්තාගෙන් ඉල්ලා සිටිය හැකි අතර ඒ කාර්යය සඳහා ඒ ණය මුදල යොදවා ඇති බව හෝ යොදවනු ලබන බව ඔප්පු කිරීම පිණිස, එසේ ඉල්ලා සිටිනු ලැබූ තැනැත්තා විසින්, අධිකාරිය ඉදිරියෙහි හෝ අධිකාරිය විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ඉදිරියෙහි හෝ සාක්ෂි ගෙනහැර දැක්විය හැකි ය.

ණයක් ප්‍රදානය කිරීම අවලංගු කිරීම ආදිය සඳහා අධිකාරිය සතු බලය.

31. (1) ණයක් ප්‍රදානය කිරීම අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ පසු සහ ණය මුදලේ සම්පූර්ණ ප්‍රමාණය ඒ සඳහා ඉල්ලුම් කළ තැනැත්තාට දෙනු ලැබීමට පෙර යම් අවස්ථාවක දී, සත්‍ය කරුණු දැනගෙන තිබුණි නම් ණය මුදල ප්‍රදානය නොකරනු ලැබිය හැකි වූ අවස්ථාවක ණය ගැනුම්කරු විසින් කරන ලද සැලකිය යුතු වැරදි ප්‍රකාශයන් හේතුකොටගෙන හෝ අධිකාරිය විසින් නියම කරුණු වරදවා වටහා ගැනීම හේතුකොටගෙන, ඒ ණය මුදල අනුමත කරනු ලැබුවේ නම්, අධිකාරිය විසින්, යම් හේතු දැක්වීමක් නොමැතිව, ණය ප්‍රදානය කිරීම අවලංගු කිරීම හෝ ණය මුදලේ ප්‍රමාණය අඩු කිරීම හෝ ණය මුදලට අදාළ කොන්දේසි මඳ වශයෙන් වෙනස් කිරීම හෝ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා සම්පූර්ණ ණය මුදල හෝ එහි යම් කොටසක් හෝ ගෙවීම අත්හිටුවිය හැකි ය.

(2) ණය ඉල්ලුම් කළ තැනැත්තාට ණය මුදලෙන් කොටසක් දෙනු ලැබීමෙන් පසු ණය මුදලක් ප්‍රදානය කිරීම (1) වන උප වගන්තිය යටතේ අධිකාරිය විසින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ කොටස ඔහුට ප්‍රදානය කර ඇති ණය මුදලේ සම්පූර්ණ ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු අතර එම අධිකාරිය විසින් ලිඛිත නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ ණය මුදල සහ ඒ සඳහා අයවිය යුතු පොලිය ද ආපසු ගෙවන ලෙස ඒ

ඉල්ලුම්කරුට නියම කළ හැකි ය. ඒ නියමය සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත ඒ නියමය අනුව කටයුතු නොකරනු ලැබූ අවස්ථාවක, ණය මුදලේ නොගෙවූ සම්පූර්ණ කොටසත් ඒ සඳහා අය විය යුතු පොලියත් සම්බන්ධයෙන් පැහැර හැරීම කරනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු අතර යම් ඉඩමක් උකසට තබා ඒ ණය මුදල ප්‍රදානය කරනු ලැබූ අවස්ථාවක, 42 සිට 61 තෙක් වූ වගන්ති වල විධිවිධාන ඒ ණය මුදලට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අතිරේක ඇප නියම කිරීමට හෝ ණය මුදල ආපසු ඉල්ලා සිටීමට හෝ අධිකාරිය සතු බලය.

32. (1) ඇපය වශයෙන් තබා ඇති දේපලෙහි අගය, ණය මුදලේ සුරක්ෂිතතාවය හානියට පත් කළ හැකි ප්‍රමාණයට අඩු වී ඇති බවට හෝ ණය ගැනුම්කරුගේ හිමිකම ප්‍රමාණවත් යයි පිළිගනු නොලැබිය යුතුව තබූ බවට අධිකාරිය සෑහීමකට පත්වන්නේ නම් නියමයෙහි නිශ්චිත කාලය ඇතුළත—

(අ) අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් සඳහා අතිරේක ඇපයක් අධිකාරිය සෑහීමට පත් වන පරිදි සලස්වනු ලැබිය යුතු බව ; සහ

(ආ) අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආපසු ගෙවනු ලැබිය යුතු බව

අධිකාරිය විසින්, ඒ සඳහා හේතු නොදක්වා, ඕනෑම අවස්ථාවක දී ලිඛිත නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(2) ණය මුදලක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ නියමයක් සඳහා ඒ නියමය මගින් ඉඩ දී ඇති කාලසීමාව තුළ ඒ අනුව කටයුතු නොකරනු ලැබූ අවස්ථාවක, ඒ ණය මුදලේ නොගෙවා ඇති සම්පූර්ණ කොටස ද එදින දක්වා ඒ සඳහා අය විය යුතු පොලිය ද සම්බන්ධයෙන් පැහැර හැරීමක් කර ඇතැයි සලකනු ලැබිය යුතු අතර, යම් ඉඩමක් උකසට තබා ඒ ණය මුදල දෙනු ලැබුවේ නම්, 42 සිට 61 තෙක් වූ වගන්තිවල විධිවිධාන ඒ ණය මුදලට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඇපය වෙනස් කිරීම, අඩු කිරීම හෝ නිදහස් කිරීම.

33. (1) අලුත් ඇපය, හුදෙක් එය ම හෝ ඉතිරි විය යුතු මුල් ඇපයේ යම් කොටසක් සහිතව අලුත් ඇපය හෝ මුල් ණය මුදල වෙනුවෙන් නොගෙවා තවමත් ඉතිරිව තිබෙන මුල් මුදලේ හා පොලියේ මුළු මුදලට සමාන වන ප්‍රමාණයක අලුත් ණය මුදලක් සඳහා ප්‍රමාණවත් වන්නේ නම්, ඒ ණය මුදල සඳහා දැනටමත් අධිකාරිය විසින් භාරගෙන ඇති යම් සම්පූර්ණ ඇපයක් හෝ එහි කොටසක් හෝ වෙනුවට අධිකාරිය විසින් අලුත් ඇපයක් භාර ගනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය වෙත උකස් කරනු ලැබූ ඉඩමක ඇපය පිට අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තකු එම ණය මුදලෙන් කොටසක් ආපසු ගෙවා මුල් මුදල හා පොලිය වශයෙන් එම ණය මුදලෙන් ලැබිය යුතු ශේෂය අය කර ගනු ලබන බවට වග බලා ගැනීමේ කාර්යය සඳහා ඒ ඇපයෙන් (මෙහි මින් මතු මේ උපවගන්තියෙහි "ප්‍රමාණවත් කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටසක් ප්‍රමාණවත් යයි අධිකාරිය සෑහීමට පත් වන අවස්ථාවක, ප්‍රමාණවත් කොටසට අමතරව ඇති ඒ ඇපයේ කොටස අධිකාරිය විසින් උකසෙන් නිදහස් කොට මුදා හරිනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය වෙත උකස් කරනු ලැබූ ඉඩමක ඇපය පිට අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලැබ ඇති යම් තැනැත්තකු එම ඉඩම හෝ එහි කොටසක් වෙනත් යම් තැනැත්ත කුට පවරා ඇති හෝ පවරන්නා වූ අවස්ථාවක, පැවරුම්ලාභී විසින් ඒ සඳහා කරනු ලැබූ ඉල්ලීමක් මත,—

(අ) ණය මුදල අනුව ගෙවීමට තිබෙන මුදල පැවරුම්කරු හා පැවරුම්ලාභී හා අතර කොටස් කර බෙදීම අධිකාරිය සෑහීමට පත්වන පරිදි කරනු ලැබුවහොත් ;

(ආ) ණය මුදලෙන් තමාට කොටස් කර බෙදා දෙනු ලැබූ ප්‍රමාණය අධිකාරියට ගෙවීමට පැවරුම්ලාභී භාරගෙන ඒ මුදල ගෙවීමට වගබලා ගන්නා බවට උකස්කරයක් අධිකාරිය සෑහීමට පත්වන පරිදි ඔහු ලියා අත්සන් කරනහොත් ; සහ

(ඇ) ඉඩමෙන් පැවරුම්ලාභී වෙත පවරනු ලැබූ කොටස උකසෙන් නිදහස් කොට මුදා හැරීමේ කාර්යය සඳහා අධිකාරියේ මතය අනුව අවශ්‍ය පියවර පැවරුම්කරු විසින් සහ පැවරුම්ලාභී විසින් ගනු ලැබුවහොත්

ඒ ඉඩමේ ඒ කොටස අධිකාරිය විසින් උකසෙන් නිදහස් කොට මුදා හරිනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ කාර්ය සඳහා ඒ එක් එක් තැනැත්තාට කොටස් කර බෙදා දෙනු ලැබූ ණය මුදලේ ප්‍රමාණය අධිකාරිය විසින් ඒ එක් එක් තැනැත්තාට ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන ඒ ඒ ණය මුදලේ ප්‍රමාණයට සහ ඒ වෙනුවෙන් සපයනු ලැබූ ඇපය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් සඳහා වූ ඇපය අන් සතු කිරීම සඳහා ඇතැම් අවස්ථාවල දී සාමාන්‍යාධිකාරිවරයාගේ අවසරය අවශ්‍ය බව.

34. (1) යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදි කිරීම, නිම කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යම් දේපළක ඇපය පිට ණය මුදලක් ප්‍රදානය කරනු ලැබූ අවස්ථාවක ඒ දේපළ සහ ඉදි කිරීමට, නිම කිරීමට, අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට ඇති ගොඩනැගිල්ල වෙනත් යම් දේපළක පිහිටා ඇති අවස්ථාවක ඒ වෙනත් යම් දේපළ, ඒ වැඩය නිම නොවී පවත්නා තාක්, සාමාන්‍යාධිකාරිවරයාගේ ලිඛිත අවසරය ඇතිව මිස සහ, ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසිවලට අනුකූලව මිස ඒ වෙනත් ගොඩනැගිල්ල විකිණීම, තෑගි දීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් අන් සතු කිරීම නොකළ යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් දේපළක් පිළිබඳ වූ යම් අන් සතු කිරීමක් හෝ බැහැර කිරීමක් ඒ උපවගන්තිය උල්ලංඝනය කරමින් සිදු වුවහොත්, අවලංගු විය යුතු අතර නීතියෙන් කිසිම බලයක් හෝ බලපෑමක් එහි නොතිබිය යුතු ය.

35. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදි කිරීම, නිම කිරීම, අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අධිකාරියෙන් ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් සඳහා ඇපය වශයෙන් දේපළක් තබා ඇති අවස්ථාවක ඒ දේපළ ද ඉදි කිරීමට, නිම කිරීමට, අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට ඇති ගොඩනැගිල්ල වෙනත් යම් දේපළක පිහිටා ඇති අවස්ථාවක ඒ වෙනත් යම් දේපළ ද, අවස්ථාවෝචිත පරිදි, අධිකාරියේ වාසියට හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ වාසියට හෝ ඇති තීන්දු ප්‍රකාශයක් නොවන යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ දේපළ නැතහොත් ඒ වෙනත් දේපළ තහනමට ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය.

ඇතැම් අවස්ථාවල දී අධිකාරියෙන් ලැබුණු ණය මුදලක් සඳහා වූ ඇපය සාමාන්‍යාධිකාරී වරයාට වාසියහගත නොවන තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ දී තහනමට ගැනීම හෝ විකිණීම නොකළ යුතු බව.

36. සෑම ණය මුදලක් ම—

(අ) අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කරන ලද්දා වූ ද එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ අන්තර කාලවල දී ගෙවනු ලබන්නා වූ ද වාරිකවලින් ; හෝ

(ආ) එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ වෙනත් යම් ආකාරයකින්,

ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ණය මුදල් ආපසු ගෙවීමේ ක්‍රමය.

37. (අ) අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලබන්නා වූ ; හෝ

(ආ) අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තකුගේ බූදලයට අන්තිම කැමති පත්‍රයක් හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් ලබා ගන්නා වූ ; හෝ

(ඇ) මියගිය ණය ගැනුම්කරුවකුගේ බූදලය නියෝජනය කිරීමට, 47 වන වගන්තිය යටතේ පත් කරනු ලබන්නා වූ ; හෝ

(ඈ) ඒ අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් සඳහා ඇපය වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ යම් ඉඩමක යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් හෝ එවැනි ණය මුදලක් සඳහා වූ වෙනත් යම් ආකාරයක ඇපයක් ස්වේච්ඡා පැවරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් අත්වන්නා වූ

සෑම තැනැත්තකුම විසින් ඔහු වෙත එවිය යුතු සියලු දැන්වීම් එවනු ලැබිය හැකි ලිපිනයක් අධිකාරිය වෙත ලියවිල්ලකින් නිවේදනය කළ යුතු ය.

ණය ගැනුම්කරුගේ ලියාපදිංචි ලිපිනය ආදිය.

38. 37 වන වගන්තිය අදාළ වන්නා වූ යම් තැනැත්තකු වෙත බාර දෙනු ලැබිය යුතු යයි නීතිය මගින් හෝ නීතිය යටතේ නියම කරනු ලැබූ යම් දැන්වීමක් ඒ වගන්තිය යටතේ ඔහු විසින් නිවේදනය කරන ලද ලිපිනයට ඒ තැනැත්තා වෙත යොමු කරනු ලැබූ ලියාපදිංචි කළ ලිපියක බහා තැපෑලෙන් යවනු ලැබුවහොත් ඒ දැන්වීම ඒ තැනැත්තා වෙත යථා පරිදි බාර දෙනු ලැබුවේ යයි

ණය ගැනුම්කරු වෙත දැන්වීම් බාර දීම ආදිය.

සලකනු ලැබිය යුතු අතර, තැපැල් මාර්ගයෙන් සාමාන්‍යයෙන් ඒ ලිපිය බාර දෙනු ලැබිය හැකි වේලාවේ දී ඒ බාරදීම ක්‍රියාත්මක කරනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ලබාදෙන ලද ණයක් අයකර ගැනීමේ දී ඇතිවන ප්‍රමුඛතාවය.

39. යම් ඉඩමක උකසක් මත අධිකාරිය විසින් ණයක් ප්‍රදානය කොට ඇති අවස්ථාවක ඒ උකස ලියාපදිංචි කිරීමේ දින සහ ඉන් පසුව ඒ ඉඩම කෙරෙහි බලපාන, එම දිනයට පෙරාතුව යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ උකසකින් සුරක්ෂිත කරනු ලැබූ ද අධිකාරිය විසින් ණය මුදල ප්‍රදානය කිරීමට පෙර සද්භාවයෙන් මුදල් දී ඇති ණය හිමියකුට අයවීමට ඇත්තා වූ ද ණයක් හැර ඒ ඉඩමට බලපාන වෙනත් සෑම ණයකට, උකසකට හෝ වැය බරකට වඩා අධිකාරියට ගෙවිය යුතු ණය සහ පොලිය ගෙවීමේ වැය බරට ප්‍රමුඛතාව හිමි විය යුතු ය.

ඉඩම් උකස් කිරීමේ ආකෘතිය.

40. (1) යම් ණයක් සඳහා ඇප වශයෙන් අධිකාරියේ නමට ලියා අත්සන් කරන ලද ඉඩම් පිළිබඳ සෑම උකසක් ම අධිකාරිය විසින් අනුමත කරන ලද ආකෘතියකට සාරානුකූලව විය යුතු ය.

(2) ණය ගන්නකු විසින් උකස යටතේ ගෙවිය යුතුව ඇති පොලිය, මුල් මුදල හෝ අන්‍යාකාර ගෙවීමත් සම්පූර්ණයෙන් සහ නියමිත දින දී ගෙවනු නොලැබුවහොත් හෝ ගෙවීම නොසලකා හැරිය හොත්, ණය මුදල ප්‍රදානය කරන ලද්දේ යම් පොලී අනුපාතිකයක් මත ද ඒ පොලී අනුපාතිකයට වඩා වැඩි අනුපාතිකයක් මත පොලිය ගෙවනු ලැබිය යුතු යයි ප්‍රතිඥප්තියක් (1) වන උපවගන්තියේ සඳහන් යම් උකසක ඇතුළත් කළ හැකි ය.

ගෙවීම් පැහැර හැරීම.

41. ඉඩමක උකසක් මත ප්‍රදානය කරනු ලැබූ යම් ණයක් සම්බන්ධයෙන් ලැබිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ලැබිය යුත්තේ මුල් මුදල වෙනුවෙන් හෝ පොලිය වෙනුවෙන් හෝ ඒ දෙකම වෙනුවෙන් හෝ වුව ද ඒ ණයෙන් නොගෙවන ලද සම්පූර්ණ කොටස සහ ඒ මත ලැබිය යුතු පොලිය සම්බන්ධයෙන් පැහැර හැරීම් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර හරිනු ලැබූ අවස්ථාවක අධිකාරිය විසින් ගත යුතු ක්‍රියා මාර්ගය.

42. මේ පනතේ විධිවිධාන යටතේ යම් ණයක නොගෙවන ලද සම්පූර්ණ කොටස සහ ඒ මත ලැබිය යුතු පොලිය පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලබන අවස්ථාවක අධිකාරිය විසින් ඒ අධිකාරියේ අභිමතය අනුව 44 වන වගන්තියේ හෝ 46 වන වගන්තියේ නියමිත පරිදි කටයුතු කළ හැකි ය. අධිකාරිය විසින් 44 වන වගන්තිය අනුව කටයුතු කරන හෝ කටයුතු කිරීමට ආරම්භ කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, 46 වන වගන්තිය යටතේ කටයුතු කිරීම අවශ්‍ය යයි ඒ අධිකාරිය විසින් සලකනු ලබන්නේ නම් ඊට පසු යම් අවස්ථාවක අධිකාරියට එසේ කටයුතු කළ හැකි ය.

උකස් කරවල ඇති වැරදි සහ එම උකස් කර සංශෝධනය කිරීම පිළිබඳ දැන් වීම.

43. අධිකාරිය විසින් දෙනු ලැබූ ණයක් සඳහා ඇප වශයෙන් යම් ඉඩමක් අධිකාරියට උකස් කරන බැඳුම්කරයක යම් ලිපි දෝෂයක් හෝ වෙනත් දෝෂයක් ඇතුළත් වන අවස්ථාවක හෝ එහි ඇතුළත් යම් විධිවිධානයක් සම්බන්ධයෙන් සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක උකස්කරු සහ අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු

විසින් එම බැඳුම්කරයෙහි අත්සන් කරනු ලැබූ පිටසනක් මගින් එම වරද නිවරද කරනු ලැබිය හැකි ය. නැතහොත් එම සංශෝධනය හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය. ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීම මත කරනු ලබන එවැනි පිටසනක් වරද නිවරද කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සහ වෙනස් කිරීම් බලගැන්වීමේ සියලු කාර්ය සඳහා ප්‍රමාණවත් විය යුතු අතර, එවැනි පිටසනක් කරනු ලැබුවේ යම් බැඳුම්කරයක ද ඒ බැඳුම්කරය ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට එසේ නිවරද කරනු ලැබූ හෝ සංශෝධනය කරනු ලැබූ හෝ වෙනස් කරනු ලැබූ පරිදි මුල දී ලියා අත්සන් කරනු ලැබුවාක් මෙන් බලාත්මක විය යුතු ය.

44. පැහැර හරිනු ලැබූ යම් ණයක් සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ යම් ඉඩමකට ඇතුළු වීමට, එම ඉඩමේ සන්තකය ගැනීමට හා කළමනාකරණය කිරීමට සහ එම ඉඩම නඩත්තු කිරීමට සහ උකස්කරු විසින් පැහැර හැරීම කරනු නොලැබුවේ නම් ඔහු විසින් එම ඉඩමේ පාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ බලතල ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් ලිඛිත නියමයක් මගින් ඒ නියමයේ සඳහන් යම් තැනැත්තකුට 47 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව බලය දෙනු ලැබිය හැකි ය.

*උකස් කරනු ලැබූ ඉඩම්වල සන්තකය ගැනීමට කළමනාකරුවකු පත් කිරීම.*

45. (1) යම් ඉඩමක් සම්බන්ධයෙන් 44 වන වගන්තිය යටතේ අධිකාරියේ නියමයකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ නියමය ප්‍රකාර සාමාන්‍යයෙන් කටයුතු කිරීමට සහ, විශේෂයෙන්—

*කළමනාකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක කාර්ය පටිපාටිය.*

(අ) එම ඉඩමෙන් ලැබෙන නිෂ්පාදන ද්‍රව්‍ය විකිණීමට ;

(ආ) එම ඉඩමෙන් බිම් කුලී, ලාභ හෝ වෙනත් ආදායම් භාර ගැනීමට ;

(ඇ) ඔහුගේ සේවා සඳහා පාරිශ්‍රමික වශයෙන් නියම කිරීම සුදුසු යයි අධිකාරිය විසින් සලකනු ලබන යම් මුදලක් වේනොත් ඒ මුදල, ඉහත සඳහන් ආදායමෙන් අඩු කර තමන් වෙත රඳවා ගැනීමට ;

(ඈ) එම ඉඩමේ පාලනය හා කළමනාකරණය සඳහා දරන ලද වියදම් ඒ ඉඩමේ ආදායමෙන් ගෙවීමට ; සහ

(ඉ) එම ඉඩමේ උකස යටතේ අධිකාරියට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවන තෙක් හෝ (2) වන උපවගන්තිය යටතේ ඉඩමේ සන්තකය භාර දීමට අධිකාරිය විසින් ඔහුට විධාන කරනු ලබන තෙක් එම ඉඩමේ සන්තකය දැරීමට

ඔහුට හිමිකම තිබිය යුතු ය.

(2) යම් ඉඩමක් සම්බන්ධයෙන් 44 වන වගන්තිය යටතේ අධිකාරියේ නියමයකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

(අ) එම ඉඩමේ ආදායමෙන් උකස්කරුගේ නඩත්තුව සඳහා අධිකාරියේ අභිමතය පරිදි අධිකාරිය විසින් නියම කරනු ලබන යම් මුදලක් වේනොත්, ඒ මුදල් මාස්පතා ගෙවීම ;

(ආ) මෙහි මින් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව එම ඉඩමේ ආදායමෙන් ඉතිරි මුදල ත්‍රෛමාසිකව හෝ අධිකාරිය විසින් විධාන කරනු ලබන අන්‍යාකාරයකින් එම තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවීම;

(ඇ) එම ඉඩම සම්බන්ධයෙන් තමා විසින් භාර ගන්නා ලද හෝ ගෙවන ලද සියලු මුදල් පිළිබඳ පැහැදිලි හා නිවැරදි වාර්තා තබාගැනීම සහ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලාන්තරයන්හි දී ඒ වාර්තා ඉදිරිපත් කිරීම; සහ

(ඈ) අධිකාරිය විසින් විධාන කරනු ලබන පරිදි උකස්කරුට හෝ යම් වෙනත් තැනැත්තකුට එම ඉඩමේ සන්තකය දීම සහ මෙහි මින් ඉහර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව එම ඉඩමේ ආදායමෙන් තමා අතෙහි ඉතිරි යම් ශේෂයක් අධිකාරියට ගෙවීම

කරනු ලැබිය යුතු ය.

(3) උකස යටතේ අධිකාරියට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලැබූ විට, උකස් කරන ලද ඉඩමේ සන්තකය අධිකාරිය විසින් උකස්කරුට ආපසු භාර දිය යුතු අතර, එම ඉඩමේ ආදායමෙන් ඉතිරි යම් ශේෂයක් ඔහුට ආපසු දෙනු ලැබිය යුතු ය.

උකස් කරනු ලැබූ ඉඩම විකිණීමට බලය දීම.

46. ගෙවීම පැහැර හරිනු ලැබුවේ යම් ණයක් ද ඒ ණය සඳහා ඇප වශයෙන් ඒ අධිකාරියට උකස් කරනු ලැබූ යම් ඉඩමක්, ඒ ණයෙන් නොගෙවන ලද සම්පූර්ණ කොටස සහ විකිණීමේ දිනය දක්වා ණය මුදල සඳහා වූ පොලිය සහ 54 වන වගන්තිය යටතේ අය කර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු අය කර ගැනීම පිණිස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, අධිකාරිය විසින් ලිඛිත නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් යම් තැනැත්තකුට 47 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව බලය දිය හැකි ය.

ණය ගන්නා මියගිය අවස්ථාවක.

47. (1) ණය ගන්නා මිය ගියේ නම් හෝ ණය ගන්නා විසින් ණය සඳහා ඇපය වශයෙන් උකස් කරන ලද ඉඩමේ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සිය කැමැත්තෙන්ම ඔප්පුවකින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙනත් යම් තැනැත්තකුට පැවරී ඇත්තේ වුව ද 44 වන සහ 46 වන වගන්තිවල විධිවිධාන, (2) වන උපවගන්තියෙහි අන්‍යාකාරයකින් විසිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ණය ගන්නා මියගිය විට සහ ඔහුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) කොළඹ දිසා අධිකරණය වෙත හෝ ණය සඳහා ඇප වශයෙන් ණය ගන්නා විසින් උකස් කරනු ලැබූ ඉඩම පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත අධිකාරිය විසින් ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට සහ අධිකරණය විසින් ආඥා කරනු ලබන පරිදි එම තැනැත්තන්ට දැන්වීම භාර දීමෙන් පසු, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම ප්‍රමාද වීමට ඉඩ ඇති බවට සෑහීමට

පත් වුවහොත් මේ උපවගන්තියේ කාර්ය සඳහා ණය ගන්නාගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත් කළ හැකි ය; තව ද

(ආ) මේ උපවගන්තිය යටතේ ඔහුගේ බූදලයට නියෝජිත යකු පත් කරනු ලබන්නේ නම් මිස සහ පත් කරනු ලබන තෙක්, ණය ගන්නා විසින් කරන ලද යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් 44 වන වගන්තියේ සහ 46 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

48. (1) යම් ඉඩමක් විකිණීමට බලය දෙමින් 46 වන වගන්තිය යටතේ වූ සෑම නියමයක් ම පිළිබඳ දැන්වීමක්, ගැසට් පත්‍රයෙහි සහ දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක සිංහල භාෂාවෙන් පළ කරනු ලැබිය යුතු අතර, ණය ගන්නා ජීවත්ව සිටින්නේ නම්, ඔහුට සහ ඒ ඉඩම සම්බන්ධයෙන් 37 වන වගන්තිය යටතේ තම ලිපිනය දන්වනු ලැබූ සෑම තැනැත්තකුට ම ඒ දැන්වීමේ පිටපත් භාර දෙනු ලැබිය යුතු ය.

ඉඩම විකිණීම සම්බන්ධයෙන් අධිකාරියේ නියමය දන්විය යුතු බව.

(2) ඒ දැන්වීමේ පිටපතක් භාර දෙනු ලැබිය යුත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ භාෂාව දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව වන අවස්ථාවක, ඒ දැන්වීමේ පිටපතකට අතිරේකව, ඒ තැනැත්තාගේ භාෂාවෙන් වූ එහි පරිවර්තනයක් ඔහුට භාර දෙනු ලැබිය යුතු ය.

49. සෑම විකිණීමක ම දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීම, විකිණීම සඳහා නියම කරනු ලැබූ දිනයට දින දහහතරකට නො අඩු කාලයකට පෙර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එම දැන්වීමේ පිටපත්—

විකිණීම පිළිබඳ දැන්වීම.

(අ) ණය ගන්නා ජීවත්ව සිටින්නේ නම්, ඔහුට සහ විකිණීමට බලය දෙන නියමය පිළිබඳ දැන්වීම 48 වන වගන්තිය යටතේ භාර දෙනු ලැබිය යුත්තේ යම් තැනැත්තකුට ද ඒ සෑම තැනැත්තකුට ම ද භාර දෙනු ලැබිය යුතු ය;

(ආ) විකුණනු ලබන ඉඩමෙහි හෝ ඒ අසල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය; තව ද

(ඇ) දිසාපති කාර්යාලයේ බිත්ති මත සහ ඒ ඉඩම පිහිටි අධිකරණ බල සීමාව තුළ ඇති දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ කීපයේ බිත්ති මත අලවනු ලැබිය යුතු ය.

50. (1) ණය මුදලේ ගෙවනු නොලැබූ කොටසෙහි සම්පූර්ණ මුදල සහ උකසේ නියමයන් අනුව ඒ ණය මුදල සඳහා ලැබිය යුතු සියලු පොලී සහ 54 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් අය කර ගනු ලැබිය යුතු යම් මුදල් සහ ගාස්තු වෙතොත්, එම මුදල් සහ ගාස්තු ද, ණය ගන්නා හෝ ණය ගන්නා විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, ණය සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ ඉඩම විකිණීම සඳහා නියම කරනු ලැබූ දිනයට පෙර අධිකාරියට ගෙවනු ලැබුවහොත් ඒ ඉඩම විකුණනු නොලැබිය යුතු අතර, ඒ ඉඩම විකිණීම සඳහා 46 වන වගන්තිය යටතේ නියමය අනුව තවදුරටත් පියවර ගනු නො ලැබිය යුතු ය.

විකිණීමට පෙර ගෙවීම.

(2) වාරිකයේ මුදල හෝ පැහැර හැරීම කරනු ලැබුවේ යම් වෙනත් ගෙවීමක් සම්බන්ධයෙන් ද ඒ වෙනත් ගෙවීම සහ උකසේ නියම යන් අනුව, ණය මුදල සඳහා ලැබිය යුතු යම් පොලියක් වෙතොත්, එය සහ 54 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් අය කර ගනු ලැබිය යුතු යම් මුදල් හෝ ගාස්තු වෙතොත් ඒ මුදල් සහ ගාස්තු සමග, ණය ගන්නා හෝ ණය ගන්නා විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, ණය සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ ඉඩම විකිණීම සඳහා නියම කරනු ලැබූ දිනයට පෙර යම් වේලාවක දී අධිකාරියට ගෙවනු ලැබුව හොත්, අධිකාරිය විසින් අධිකාරියේ අභිමතය අනුව එම ඉඩම විකුණනු නොලැබිය යුතු බවට සහ එම විකිණීම සඳහා 46 වන වගන්තිය යටතේ නියමය අනුව තවදුරටත් පියවර නොගත යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

අඩුම වෙන්දේසි මිල.

51. ණය සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ ඉඩමක් විකුණනු ලබන අවස්ථාවක, අධිකාරිය විසින් අඩුම වෙන්දේසි මිලක් නියම කළ හැකි අතර අධිකාරිය හැර වෙනත් යම් තැනැත්තකුට ඉන් අඩුව විකුණනු නොලැබිය යුතු ය.

අධිකාරියට උකස් කරනු ලැබූ දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන විට අධිකාරිය විසින් ලංසු තබා මිලට ගත හැකි බව.

52. යම් ණයක් සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ යම් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක දී සාමාන්‍යාධිකාරීවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ අධිකාරිය සඳහා සහ ඒ වෙනුවෙන් ඒ ඉඩම ලංසු තබා මිලට ගත හැකි ය.

එකම ඉඩම පිළිබඳ ණය දෙකකින් එක් ණයක් සම්බන්ධයෙන් පැහැර හැරීම.

53. එකම ඉඩමේ ඇපය මත අධිකාරිය විසින් ණය දෙකක් දෙනු ලැබූ කවර වූ අවස්ථාවක සහ ඒ ණයවලින් යම් එක් ණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අනික් ණය සම්බන්ධයෙන් පැහැර හැරීමක් කරනු නොලැබුවේ වුව ද, මේ කොටසේ ඉහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය. එවැනි අවස්ථාවක එම ණය දෙක සම්බන්ධයෙන් අධිකාරියට ලැබිය යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා 46 වන වගන්තිය යටතේ නියමයකින් ඉඩම විකිණීමට බලය දිය හැකි අතර, ඒ සඳහා මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

අධිකාරිය විසින් දරන ලද වියදම් සහ ගාස්තු අයකර ගැනීම.

54. (1) යම් ණයක් මත ලැබිය යුතු මුදලට අතිරේකව ණය ගන්නාගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු ගෙන්—

(අ) ණය දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලද උකස්කරයේ ඇතුළත් ප්‍රතිඥප්තිවලට අනුකූලව අධිකාරියට උකස් කරනු ලැබූ ඉඩම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ යම් රක්ෂණ ඔප්පුවක් යටතේ වාරික සහ වෙනත් ගාස්තු ගෙවීමේ දී අධිකාරිය විසින් වියදම් කරන ලද සියලු මුදල් සහ අධිකාරිය විසින් දරනු ලැබිය යුතු බවට ඉහත සඳහන් ප්‍රතිඥප්තිවලින් බලය දෙනු ලැබූ වෙනත් සියලු ගාස්තු සහ අය කිරීම්; සහ

(ආ) ඉඩම විකිණීම පිළිබඳව ප්‍රචාරය කිරීමේ සහ උකස් කරනු ලැබූ ඉඩම විකිණීමේ ගාස්තු

අධිකාරිය විසින් අය කර ගත හැකි ය:

එසේ වුව ද මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගාස්තු වශයෙන් අයකර ගනු ලබන මුදල ණය මුදලෙන් නියම කරනු ලබන යම් ප්‍රතිශතයකට වැඩි නොවිය යුතු ය.

(2) උකස් කරනු ලැබූ ඉඩම අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරිවරයා විසින් මිලට ගන්නා අවස්ථාවක (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදයන්හි සඳහන් ගාස්තු අධිකාරියේ අරමුදලින් ඔහු විසින් ගෙවිය යුතු ය. තවද ඔහු විසින් ඒ උපවගන්තිය යටතේ ණය ගන්නාගෙන් එම මුදල් සහ ගාස්තු අයකර ගැනීමෙන් පසු එසේ අයකර ගනු ලැබූ මුදල අරමුදලට බැර කළ යුතු ය.

55. උකස් කරනු ලැබූ ඉඩම විකුණනු ලැබූ අවස්ථාවක, උකස මත ලැබිය යුතු මුදල සහ 54 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු, විකිණීමෙන් ලත් මුදලින් අඩු කිරීමෙන් පසු යම් ශේෂයක් වේනොත්, එම ශේෂය ණය ගන්නාට හෝ ණය ගන්නාට ලැබිය යුතු ගෙවීම් භාර ගැනීමට නීත්‍යානුකූල හිමිකම ඇති යම් තැනැත්තකුට අධිකාරිය විසින් ගෙවිය යුතු ය. මුදල් ගෙවිය යුත්තේ කවුරුන්හටදැයි යන්න පිළිබඳව අධිකාරියට සැකයක් ඇත්නම්, එම මුදලට හිමිකම ඇති තැනැත්තා විසින් ලබාගැනීම පිණිස එම ඉඩම පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයට ගෙවනු ලැබිය යුතු ය. විකිණීමෙන ලත් මුදලින් අධිකාරියට ලැබිය යුතු මුදල අඩු කිරීමෙන් පසු ශේෂය ගෙවිය යුතු බව.

56. (1) උකස් කරනු ලැබූ ඉඩම විකුණනු ලබන අවස්ථාවක අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරීවරයා විසින් විකුණුම් සහතිකයක් අත්සන් කළ යුතු අතර, එවිට ඉඩමට සහ ඉඩමෙහි ණය ගන්නාගේ අයිතිය, හිමිකම සහ සම්බන්ධතාව ගැනුම්කරු සතු විය යුතු ය. තව ද ඉන් පසුව ඒ ඉඩම අධිකාරියට උකස් කරන ලද දිනයට පසු කරන ලද හෝ ලියාපදිංචි කරන ලද ඒ ඉඩමට හෝ ඉඩම පිළිබඳව ණය ගන්නාට ඇති අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව පිළිබඳ කවර වූ හෝ බැහැර කිරීමක් මගින් හෝ යටතේ හිමිකම් පාන යම් තැනැත්තකු විසින් කවර හෝ යම් හේතුවක් මත යම් අධිකරණයක දී ඒ විකිණීම අවලංගු කිරීම සඳහා හෝ ගැනුම්කරුට විරුද්ධව ඒ ඉඩම පිළිබඳව යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඔප්පු කිරීම සඳහාත් ක්‍රියා කරනු ලැබීමට බලය නොතිබිය යුතු ය. විකුණුම් සහතිකය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරීවරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් යම් ඉඩමක් විකිණීම සම්බන්ධයෙන් ඒ ඉඩම විකිණීමට අදාළ මේ කොටසේ සියලු විධිවිධාන අනුකූලව කටයුතු කර ඇති බවට තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

(3) විකුණුම් සහතිකය අධිකාරිය විසින් අනුමත කරනු ලබන ආකෘතිය අනුව විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම විකුණුම් සහතිකයක් ම නිශ්චල දේපළ පැවරීමකට සේ ම මුද්දර ගාස්තු, ගාස්තු සහ නීතියෙන් බලය දෙනු ලැබූ වෙනත් ගාස්තුවලට යටත් විය යුතු අතර, ගැනුම්කරු විසින් එකී සියලු ගාස්තු ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරිවරයා ගැනුම් කරු වන අවස්ථාවක ඔහු වෙත නිකුත් කරනු ලැබූ විකුණුම් සහතිකය නිශ්චල දේපළ පැවරීමකට සේ ම මුද්දර ගාස්තු, ගාස්තු සහ යම් ලියාපදිංචි කිරීමේ සහ නීතියෙන් බලය දෙනු ලැබූ වෙනත් ගාස්තුවලට යටත් විය යුතු අතර, අධිකාරිය විසින් එකී සියලු ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

විකිණීම අවලංගු කිරීමේ නඩු ආදිය සීමා කිරීම.

57. උකස් කරනු ලැබූ ඉඩම විකුණනු ලබන අවස්ථාවක, විකිණීමේ දිනයට පසු මාස තුනක් ඉකුත් වීමෙන් පසුව—

(අ) කවර වූ හෝ යම් හේතුවක් නිසා විකිණීම අවලංගු කිරීමේ, හෝ

(ආ) ගැනුම්කරුට විරුද්ධව, ඉඩමට හෝ ඉඩමෙහි, යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වාගෙන යාමේ

කාර්යය සඳහා යම් අධිකරණයක නඩුවක් හෝ නඩු කටයුත්තක් හෝ 58 වන වගන්තිය යටතේ ගැනුම්කරු විසින් අධිකරණයකට කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් යම් විත්තිවාචකයක් හෝ ආරම්භ කරනු නොලැබිය යුතු ය.

සන්තකය භාරදීම සඳහා ආඥාව.

58. (1) මේ කොටසේ ඉහතින් වූ විධිවිධාන අනුව විකුණනු ලැබූ යම් ඉඩමක ගැනුම්කරු විසින් කොළඹ දිසා අධිකරණයට හෝ ඉඩම පිහිටියේ යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට හෝ ඉල්ලුම් කරනු ලැබ 56 වන වගන්තිය යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ විකුණුම් සහතිකයේ සහතික පිටපතක් ඉදිරිපත් කරනු ලැබූ විට ඒ ඉඩමේ නිරවුල් සන්තකය භාරදීම සඳහා ආඥාවක් ලබාගැනීමට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සෑම ඉල්ලීමක් ම පෙත්සමක සහ දිවුරුම් පත්‍රයක මාර්ගයෙන් කරනු ලැබිය යුතු අතර, 56 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විකුණුම් සහතිකයේ සහතික පිටපතක් ඊට අමුණනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීමේ කාර්යය සඳහා අධිකාරිය හෝ ඒ වෙනුවෙන් යම් තැනැත්තකු හැර වෙනත් යම් තැනැත්තකු විසින් ඒ උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට සහ ඊට ආනුෂංගිකව පවත්වන ලද සියලු නඩු කටයුතු සඳහා, තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු යම් මුද්දර ගාස්තු සහ නියමිත ගාස්තු ප්‍රමාණයන් අනුව, මුද්දර ගාස්තු සහ වෙනත් ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ විට දේපළෙහි සන්තකය ගැනුම්කරුට භාර දීමට ආඥාවක් දිසා අධිකරණය විසින් වහාම කළ යුතු අතර, ආඥාවෙහි සඳහන් දිනයට පෙර ගැනුම්කරුට හෝ ඒ කාර්යය සඳහා ඔහු විසින් පත් කරන ලද යම් වෙනත් තැනැත්තකුට ඒ ස්ථානයේ සන්තකය භාරදීමට

සහ පදිංචිකරු සහ ඔහුගේ යම් යැපෙන්නන් ඇත්නම් ඔවුන් සහ ඒ ඉඩමේ හෝ ස්ථානයේ හෝ එහි යම් කොටසක පදිංචි වෙනත් සෑම තැනැත්තකුම ඒ ස්ථානයෙන් නෙරපීමට නියම කරමින්, හා බලය දෙමින් සන්තකය භාරදීමේ ආඥාවක් පිස්කල්වරයා වෙත නිකුත් කළ යුතු ය. අධිකරණය විසින් නියම කරනු ලැබූ කාලය ඇතුළත සන්තකය භාරදීමට පිස්කල්වරයාට නොහැකි වුවහොත් ඒ ආඥාව ක්‍රියාවේ යොදවන කාලසීමාව දීර්ඝ කරමින් ඒ ආඥාව නැවත නිකුත් කිරීමට අධිකරණයට බලය තිබිය යුතු ය. පිස්කල්වරයාට නිකුත් කරනු ලැබූ ආඥාව ක්‍රියාවේ යෙදවීමේ දී පිස්කල්වරයා විසින් හෝ පොලිස් නිලධරයා විසින් හෝ පිස්කල්වරයා හෝ පොලිස් නිලධරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ ආඥාව අදාල වන්නේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද එම ස්ථානයට ඇතුළුවීමට සහ ආඥාව නිකුත් කරනු ලැබුවේ යම් දිසා අධිකරණයක් විසින් ද ඒ දිසා අධිකරණයේ විධාන අනුව එම ස්ථානයේ සන්තකය භාරදීමට අවශ්‍ය බලය පාවිච්චි කළ හැකි ය.

(4) ගැනුම්කරු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ අවස්ථාවේ ම ඉල්ලීමෙහි වගඋත්තරකරු වශයෙන් නම් කරනු ලැබූ තැනැත්තා වෙත ඒ පිළිබඳ දැන්වීමක් පෞද්ගලිකව භාරදීමෙන්, ලියා පදිංචි තැපැලෙන් හෝ විදුලි පණිවුඩයකින් නිකුත් කළ යුතු ය. එහෙත් ඒ තැනැත්තාට එම දැන්වීම නොලැබීම නිසා මේ වගන්තිය යටතේ නඩු කටයුතු අවලංගු නොවිය යුතු ය.

විකිණීම අවලංගු කිරීම.

59. විකුණනු ලැබූ ඉඩම අධිකාරිය විසින් මිලට ගනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් ඒ ඉඩම නැවත විකුණනු ලබන යම් අවස්ථාවකට පෙර, ණයකරු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ඉඩම විකුණනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල (තහනමට ගැනීමේ හා විකිණීමේ ගාස්තු ඇතුළුව) සහ ඒ මුළු මුදල සඳහා නියමිත අනුපාතිකයකට වැඩි නොවන අනුපාතිකයක් මත පොලිය ද ගෙවූ විට, විකුණුම් සහතිකයේ සහතික පිටපතක විකිණීම අවලංගු කරන බවට පිටසනක් කිරීමෙන් අධිකාරිය විසින් විකිණීම අවලංගු කළ හැකිය. එවැනි පිටසනක් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට මේ කොටස යටතේ විකිණීම කරනු නොලැබුවාක් මෙන් ඒ ඉඩම නැවත ණයකරු සතු විය යුතු ය.

අධිකාරිය විසින් නැවත විකිණීම.

60. (1) විකුණනු ලැබූ ඉඩම අධිකාරිය විසින් මිලට ගනු ලැබ සහ 59 වන වගන්තිය යටතේ විකිණීම අවලංගු කරනු නොලැබ ඇති කුමන හෝ අවස්ථාවක දී වුව ද අධිකාරිය විසින් ඉඩම නැවත විකුණා අධිකාරිය විසින් සත්‍ය පිටපතක් ලෙස සහතික කරනු ලබන විකුණුම් සහතිකයේ පිටපතක පිටසන් කිරීමෙන්, අධිකාරිය විසින් අත්කර ගන්නා ලද ඒ ඉඩමට හෝ ඒ ඉඩමේ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරුට පැවරිය හැකි ය.

(2) 56 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විකුණුම් සහතිකයකට අදාළ වන ආකාරයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද පිටසනකට ඒ විධිවිධාන අදාළ කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද පිටසනක් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට එසේ සඳහන් අයිතිවාසිකම, හිමිකම සහ සම්බන්ධතාව ඒ පිටසනෙහි සඳහන් ගැනුම්කරු සතු විය යුතු ය.

අයකර ගැනීමේ වෙනත් ක්‍රමවලින් අධිකාරිය නොවළක්වන බව.

61. යම් වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව යම් උකස්කරයක් මත ලැබිය යුතු මුදල අයකර ගැනීමෙන් 42 වන වගන්තියේ සිට 60 වන වගන්තිය දක්වා කිසිවකින් අධිකාරිය වළක්වනු ලබන බව නොසැලකිය යුතු ය.

## VII වන කොටස

### අධිකාරියට අයත් නිවාස, මහල් නිවාස සහ වෙනත් යම් ගොඩනැගිලිවල සන්තකය සාමාන්‍යාධිකාරිවරයා විසින් ආපසු ලබා ගැනීම

මේ කොටස අදාල වන්නා වූ නිවාස, මහල් නිවාස සහ වෙනත් ගොඩනැගිලි සහ "ගෙහිමියා" සහ "පදිංචිකරු" යන යෙදුම්වල අර්ථ කථනය.

62. (1) යම් තැනැත්තකු විසින් පදිංචිවීම සඳහා යම් කුලියක් ගෙවීම මත හෝ අන්‍යාකාරයකින් අධිකාරිය විසින් සපයනු ලැබූ "ගොඩනැගිල්ල" වශයෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලබන සෑම නිවාසයකට ම, මහල් නිවාසයකට ම හෝ වෙනත් යම් ගොඩනැගිල්ලකට ම මේ කොටස අදාළ විය යුතු ය.

(2) යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා අධිකාරිය විසින් ගොඩනැගිල්ලක් සලසනු ලැබූ අවස්ථාවක් වූ විට ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මේ කොටසෙහි "ගෙහිමියා" යන යෙදුමෙන් සාමාන්‍යාධිකාරිවරයා අදහස් වන අතර මේ කොටසෙහි "පදිංචිකරු" යන යෙදුමෙන් ඒ තැනැත්තා අදහස් වේ.

මේ කොටස අදාල වන්නාවූ ගොඩනැගිල්ල අත්හැරීමට යටත් වන බව.

63. (1) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක පදිංචිකරුට සහ එම ගොඩනැගිල්ලෙහි හෝ එහි යම් කොටසක හෝ පදිංචි ඔහුගේ යැපෙන්නන්ට සහ වෙනත් සෑම තැනැත්තකුට ම, පදිංචිකරු විසින් එම ගොඩනැගිල්ලෙහි පදිංචිය නීත්‍යානුකූල ලෙස අවසන් කිරීමේ දිනයට පසු, එම ගොඩනැගිල්ලෙහි හෝ එහි කොටසක පදිංචි වීමට හිමිකම නොතිබිය යුතු ය. තව ද මේ අනුව පදිංචිකරු විසින් එම දිනයෙහි ගොඩනැගිල්ල හිස් කොට එහි සන්තකය ඔහුගේ ගෙහිමියාට භාර දිය යුතු අතර, එම ඉඩමේ හෝ ස්ථානයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් සෑම තැනැත්තකු සමඟ ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් හෝ ස්ථානයෙන් පිට විය යුතු ය.

(2) මේ කොටස අදාළ වන්නා වූ යම් ගොඩනැගිල්ලක් ගෙහිමියාගේ සේවයෙහි නියුක්ත යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා ගෙහිමියා විසින් සපයනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාගේ සේවා නියුක්තිය නීත්‍යානුකූල ලෙස අවසන් වන දිනයක මේ කොටසේ කාර්යයන් සඳහා එම ගොඩනැගිල්ලෙහි ඒ තැනැත්තාගේ පදිංචිය නීත්‍යානුකූල ලෙස අවසන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් පදිංචිකරුගේ සේවයෙහි නියුක්ත වීම දැන්වීමක් නොමැතිව අවසන් කරනු ලැබූ යම් අවස්ථාවක, ඒ උපවගන්තියෙහි ඔහුගේ සේවා නියුක්තිය නීත්‍යානුකූල ලෙස අවසන් කරනු ලැබූ දිනය වශයෙන් වූ සඳහන් කිරීම, ඔහුගේ

සේවා නියුක්තිය සැබවින්ම අවසන් කරනු ලැබූ දින සිට දවස් දහහතරකට පසු දිනය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් සේ සලකනු ලැබිය යුතු ය.

සන්තකය ආපසු ලබාගැනීම සහ නයිසයි ආඥාව භාරදීම සඳහා අධිකරණයට ඉල්ලීම.

64. (1) මේ කොටස අදාළ වන්නා වූ යම් ගොඩනැගිල්ලක පදිංචිකරු 63 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් අවස්ථාවක, ගොඩනැගිල්ල පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසයක ද ඒ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා වෙත ගොඩනැගිල්ලේ සන්තකය ලබා ගැනීම සඳහා සහ ගොඩනැගිල්ල පිහිටියේ යම් ඉඩමක ද නැතහොත් ස්ථානයක ද ඒ ඉඩමෙන් හෝ ස්ථානයෙන් පදිංචිකරු, ඔහුගේ යැපෙන්නන් හෝ එම ඉඩමේ හෝ ස්ථානයේ හෝ එහි යම් කොටසක පදිංචි සෑම තැනැත්තකු ම නෙරපීම සඳහා ආයාචනය කරමින් ඉල්ලීමක් ගෙහිමියා විසින් ඉදිරිපත් කිරීම නිත්‍යානුකූල විය යුතු ය. තව ද පදිංචිකරුගේ පදිංචිය අවසන් වන්නා වූ කාලය සහ ආකාරය දක්වන දිවුරුම් පත්‍රයකින් එවැනි සෑම ඉල්ලීමක් ම සනාථ කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට—

(අ) ආඥාව භාරදීමේ දින සිට ලිත් මාස දෙකකට පසු දිනයක් නොවන්නා වූ, ආඥාවේ සඳහන් දිනයක පෙනී සිටීමට; සහ

(ආ) 63 වන වගන්තියෙන් නියම කරනු ලැබූ පරිදි ගොඩනැගිල්ලේ සන්තකය ඔහු විසින් භාර දී, එම ඉඩමේ හෝ ස්ථානයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් සෑම තැනැත්තකු ම සමග ගොඩනැගිල්ල පිහිටියේ යම් ඉඩමක ද නැතහොත් යම් ස්ථානයක ද ඒ ඉඩමෙන් හෝ ස්ථානයෙන් පිට වී යාම නොකළ යුත්තේ කවර හේතු නිසාදැයි හේතු දැක්වීමට

නියම කරමින්, ඉල්ලීමෙහි සහ දිවුරුම් පත්‍රයේ පිටපතක් ද සහිතව, නයිසයි ආඥාවක් පදිංචිකරු වෙත භාරදීමට අධිකරණය විසින් සැලැස්විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නයිසයි ආඥාවක් පිස්කල්වරයා විසින් හෝ පිස්කල්වරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ඔහුට භාර දෙනු ලැබුවහොත් නැතහොත් එය එසේ භාර දෙනු ලැබිය නොහැකි අවස්ථාවක, පිස්කල්වරයා විසින් හෝ ඉහත කී පරිදි බලය දෙනු ලැබූ තැනැත්තා විසින් එම ආඥාව අදාළ වන්නා වූ ගොඩනැගිල්ලේ පැහැදිලිව පෙනෙන යම් කොටසක අලවා තබනු ලැබුවහොත් එය පදිංචිකරු වෙත භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු විභාගය අඩාලව කල් තැබීම.

65. (1) මේ කොටස යටතේ නයිසයි ආඥාවක් භාර දෙනු ලැබූ යම් පදිංචිකරුවකු ආඥාවෙහි සඳහන් දිනයෙහි අධිකරණය ඉදිරියේ පෙනී සිට දිවුරුම් පත්‍රයකින් හෝ ප්‍රතිඥා හෝ දිවුරුම් මත වූ ප්‍රකාශයකින්, අධිකරණයේ මතය අනුව නඩු විභාගය අඩාලව කල් තැබීමක් අවශ්‍ය වන්නා වූ යම් විත්තිවාචකයක් මතු කරන්නේ නම්, මතු කරන ලද විසඳිය යුතු කරුණ හෝ කරුණු අධිකරණය විසින් වහාම නිශ්චය කොට වාර්තාගත කොට නඩුවේ අවස්ථාගත කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව හැකි ඉක්මණින් සාක්ෂි විභාග

කිරීම සඳහා දිනයක් නියම කළ යුතු ය. එවැනි අවස්ථාවක දී සිතාසියේ සඳහන් වේලාවක සහ ස්ථානයක ඔහුගේ පැමිණ පෙනී සිටීමට විධාන කරමින්, පාර්ශ්වකරුවන් විසින් අවශ්‍ය කරනු ලබන, සෑම සාක්ෂිකරුවකුට ම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සිතාසි නිකුත් කළ යුතු ය.

(2) යම් නඩුවක් විභාග කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ යම් දිනයක් නියම කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ නඩු විභාගය යම් පසු දිනයක් සඳහා අඩාලව කල් තැබීමට නඩුවේ සියලු පාර්ශ්වකරුවන් කැමති වුවහොත් හැර; හෝ

(ආ) නඩුවට වැදගත් වන සිද්ධි දැන සිටින්නා වූ හෝ ඔප්පු කිරීමට හැකි සාක්ෂිකරුවකු අපසහයෝගය නොවන වෙනත් හේතුවක් පිට නොපැමිණ සිටීම නිසා ඒ නඩු විභාගය යම් පසු දිනයක් සඳහා අඩාලව කල් තැබීම අවශ්‍ය යයි දිවුරුම් පිට හෝ ප්‍රතිඥාවක් පිට හෝ දිවුරුම් පත්‍රයක් පිට හෝ ඉදිරිපත් කරනු ලබන සාක්ෂි අනුව, අධිකරණය සෑහීමකට පත් වුවහොත් හැර,

ඒ නඩු විභාගය නැවත යම් පසු දිනයක් සඳහා අඩාලව කල් නොතැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නඩුව විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ දින හෝ (2) වන උපවගන්තිය යටතේ එම විභාගය අඩාලව කල් තබනු ලැබිය හැකි යම් වෙනත් දිනයක් වෙතොත්, එම දිනයෙහි හෝ යම් ලිඛිත නීතියක පටහැණිව කුමක් සඳහන් වුව ද මතු කරනු ලැබූ විසඳිය යුතු කරුණු අධිකරණය විසින් විභාග කොට නිශ්චය කළ යුතු අතර, ඒ පිළිබඳව නඩු තීන්දුව දෙනු ලැබිය යුතු ය.

සන්තකය භාරදීම සඳහා ආඥාවක් නිකුත් කිරීම සහ එය ක්‍රියාවේ යෙදවීම.

**66.** (1) මේ කොටස යටතේ නයිසයි ආඥාවක් භාරදෙනු ලැබූ යම් පදිංචිකරුවකු ඒ ආඥාවෙහි සඳහන් දින හෝ මේ කොටස යටතේ නඩු විභාගය අඩාලව කල් තබනු ලබන යම් වෙනත් දිනයක් වෙතොත්, ඒ දිනයෙහි පෙනී සිටින්නේ නැති නම් හෝ පෙනී සිට, ආඥාවේ සඳහන් ගොඩනැගිල්ලේ සන්තකය 63 වන වගන්තියෙන් නියම කරනු ලැබූ පරිදි භාරදීම සහ ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් හෝ ස්ථානයෙන් තම යැපෙන්නන් සහ එම ඉඩමෙහි හෝ ස්ථානයෙහි හෝ එහි යම් කොටසක පදිංචි වෙනත් සෑම තැනැත්තකු සමග පිටවීයාම කළ යුතු නොවන්නේ මන්දැයි යන්නට පිළිගත හැකි හා වලංගු හේතු දැක්වීමට අපොහොසත් වන්නේ නම් නයිසයි ආඥාව නියත ආඥාවක් කළ යුතු ය. තව ද ඒ ආඥාව නිකුත් කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයේ සිට ලිත් මාස දෙකකට කලින් නොවන්නා වූ ද ලිත් මාස දෙකකට පසු නොවන්නා වූ ද ආඥාවේ සඳහන් දිනයකට පෙර ගෙහිමියාට හෝ එම කාර්යය සඳහා ගෙහිමියා විසින් පත් කරනු ලැබූ යම් වෙනත් තැනැත්තකුට ගොඩනැගිල්ලේ සන්තකය භාරදීමට සහ ගොඩනැගිල්ලේ පිහිටි ඉඩමෙන් හෝ ස්ථානයෙන් හෝ එහි යම් කොටසකින් පදිංචිකරු, ඔහුගේ යැපෙන්නන් සහ එම ඉඩමේ පදිංචි වෙනත් සෑම තැනැත්තකුම නෙරපීමට නියම කරමින් සහ බලය දෙමින් දිස්ත්‍රික්කයේ

පිස්කල්වරයාට සන්තකය භාරදීමේ ආඥාවක් අධිකරණය විසින් වහාම නිකුත් කිරීම හෝ, අවශ්‍ය වුවහොත් නැවත නිකුත් කිරීම කළ යුතු ය:

එසේ වුව ද, මෙහි මින් මතු අර්ථකථනය කරනු ලබන පරිදි යම් සාධාරණ හේතුවක් මත ආඥාව නිකුත් කරනු ලැබීම කල් දැමීම අවස්ථාවෝචිත බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ගොඩනැගිල්ලේ සන්තකය භාරදීමට සහ එම ඉඩමේ හෝ ස්ථානයේ හෝ එහි යම් කොටසක පදිංචි ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් සෑම තැනැත්තකු සමඟ ඉඩමෙන් හෝ ස්ථානයෙන් පිට වීමට පදිංචිකරු පැහැර හරින්නේ නම් මිස, ඒ ආඥාව නිකුත් කරනු නොලැබිය යුතු බවට අධිකරණය විසින් විධාන කළ හැකිය.

(2) ඉහතින් වූ අතුරු විධානයෙහි "සාධාරණ හේතුව" යන්නෙන්—

(අ) පදිංචිකරුගේ හෝ ඔහුගේ යම් යැපෙන්නකුගේ අසනීපය; හෝ

(ආ) 63 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක පදිංචිකරුට නීත්‍යානුකූලව ලැබිය යුතු යම් වේතන ගෙවීමට හෝ, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සේවා යෝජකයකුගේ තත්ත්වයෙන් ගෙහිමියාගෙන් තමාට ලැබීමට හිමිකම් ඇත්තා වූ යම් ප්‍රතිලාභ හෝ වර ප්‍රසාද පිරිනැමීමට ගෙහිමියා පැහැර හැරීම; හෝ

(ඇ) පදිංචිකරුට නිසි පරිදි දෙනු ලැබිය යුතු ඉවත් වූ බවට සහතිකයක් හෝ අනන්‍යතා සහතිකයක් හෝ ගෙහිමියාගේ තත්ත්වයෙන් පදිංචිකරුට නිකුත් කිරීමට ගෙහිමියා විසින් පැහැර හැරීම; හෝ

(ඈ) නිශ්චිත ප්‍රමාණයකින් වූ ගෙවල් කුලී යම්කිසි වාර ගණනක් ගෙවීමෙන් පසු පදිංචිකරු අයිතිකරු බවට පත්වීමේ නියම මත ගොඩනැගිල්ල කුලියට දෙනු ලැබූ අවස්ථාවක, ගෙහිමියා සහ පදිංචිකරු අතර ඇතිකරගනු ලැබූ ගිවිසුමක, ඔහුගේ පදිංචිය අවසන් කරනු ලබන විටක ආපසු ගෙවීම සඳහා විධිවිධාන සලසනු ලැබූ යම් මුදලක් පදිංචිකරුට ගෙවීමට ගෙහිමියා විසින් පැහැර හැරීම

අදහස් වේ.

67. මේ කොටස යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ යම් අවසාන නඩු තීන්දුවක් හෝ කරනු ලැබූ අවසාන නඩු තීන්දුවක් හෝ කරනු ලැබූ අවසාන නඩු තීන්දුවක බලය ඇති යම් ආඥාවක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එම නඩු තීන්දුවේ හෝ ආඥාවේ දින සිට (රජයේ නිවාඩු දින හැර) දින දහහතරක කාලයක් ඉකුත් වීමට පෙර එම නඩු තීන්දුවට හෝ ආඥාවට විරුද්ධව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 755 සහ 756 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකි ය. මහෙස්ත්‍රාත් අධිකරණවල තීන්දු ප්‍රකාශවලට හෝ ආඥාවලට විරුද්ධව අභියාචනා සම්බන්ධයෙන් අදාළ යම් වෙනත් ලිඛිත නීතියක විධිවිධාන මේ කොටස අදාළ වන්නා වූ නිවාසවලින්, මහල් නිවාසවලින් සහ වෙනත් ගොඩනැගිලිවලින් නෙරපීම සඳහා වූ සියලු නඩු කටයුතුවලදී ද අදාළ විය යුතු ය. අභියාචනා.

මේ කොටස අදාල වන්නා වූ ගොඩනැගිලිවලින් නෙරපීම සඳහා වූ සියලු නඩුවල දී මේ පනතේ විධිවිධාන අනන්‍ය වශයෙන් අදාල විය යුතු බව.

68. මේ කොටස අදාළ වන්නා වූ යම් ගොඩනැගිල්ලක සන්තකය ලබා ගැනීම සඳහා හෝ ගොඩනැගිල්ල පිහිටි යම් ඉඩමක ද නැත හොත් ස්ථානයක ද ඒ ඉඩමෙන් හෝ ස්ථානයෙන් පදිංචිකරු නෙර පීම සඳහා හෝ මේ කොටසේ විධිවිධාන යටතේ හැර නඩුවක් පවරනු නොලැබිය යුතුය.

ගාස්තු, අය කිරීම සහ මුද්දර ගාස්තු.

69. නෛතික කටයුතු පිළිබඳ ගාස්තු සම්බන්ධයෙන් මුද්දර ආඥා පනතේ විධිවිධාන සහ ගාස්තු සහ අය කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාල කිරීමේ කාර්ය සඳහා මේ කොටස යටතේ නඩු කටයුතු රුපියල් පණහක් වටිනාකම ඇති මුදල් නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ 64 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඒ වටිනාකම ඇති මුදල් සම්බන්ධ නඩුවක පැමිණිල්ලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### සාමාන්‍ය

සාමාන්‍යාධිකාරී වරයාගේ සහතිකය.

70. නිශ්චිත තැනැත්තකුගෙන් මේ පනත යටතේ අධිකාරියට මුදල් ප්‍රමාණයක් ලැබිය යුතු බවට මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග යටතේ හෝ සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සාමාන්‍යාධිකාරීවරයා විසින් හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබූ බව පෙනීයන්නේ නම් එය අත්සන් කරනු ලැබූ සාමාන්‍යාධිකාරීවරයාගේ හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තාගේ අත්සන ඔප්පු කිරීමක් නොමැතිව යම් අධිකරණයක එම සිද්ධි පිළිබඳ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

අධිකාරියට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

71. (1) නිශ්චිත තැනැත්තකුගෙන් නිශ්චිත දිනයක අධිකාරියට මුදල් ප්‍රමාණයක් ලැබිය යුතු බවට සාමාන්‍යාධිකාරීවරයා විසින් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක්, ඒ තැනැත්තා පදිංචි හෝ ඒ තැනැත්තාට අයිති චංචල හෝ නිශ්චල දේපළ පිහිටි දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ දේපළ තබා ඇති ස්ථානයට ඒ තැනැත්තා ඇතුළු වීම වළක්වමින් හෝ ඒ දේපළ එම ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීමෙන් හෝ අවසර දීමෙන් ඒ තැනැත්තා වළක්වමින් ඉන්ජන්ක්ෂන් තහනමක් අධිකරණය විසින් නිකුත් කළ යුතු අතර ඒ මුදල අයකර ගැනීම සඳහා ඒ තැනැත්තාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යම් කොටසක් හෝ තහනමට ගැනීමට බලය දෙමින් සහ විකිණීමට නියම කරමින් පිස්කල්වරයා වෙත ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන සහ 297 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ තහනමට ගැනීමට සහ විකිණීමට අදාළ කළ යුතු ය.

(2) සාමාන්‍යාධිකාරීවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලබන්නේ යම් අවස්ථාවක ද ඒ අවස්ථාවේ ම ඒ සහතිකය පිළිබඳ දැන්වීමක් සහතිකයේ සඳහන් තැනැත්තාට පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ විදුලි පණිවිඩ මගින් හෝ ඔහු විසින් නිකුත් කළ යුතුය. එහෙත් ඒ තැනැත්තාට ඒ දැන්වීම නොලැබීම හේතුවෙන් මේ වගන්තිය යටතේ නඩු කටයුතු අවලංගු නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ අධිකාරියට ලැබිය යුතු මුදල් වෙනත් යම් ආකාරයකින් හෝ ඒ වෙනුවෙන් අදාළ කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්ය පටිපාටියක් මගින් හෝ අයකර ගැනීමට අධිකාරියේ හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ අයිතිය කෙරෙහි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් බල නොපෑ යුතු ය.

72. (1) මේ පනත යටතේ අධිකාරියට මුදලක් ගෙවීමට යටත් යම් තැනැත්තෙක්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ පළාත් පාලන සේවයේ හෝ අධිකරණ සේවයේ හෝ යම් වාණිජ ආයතනයක හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක සේවා නියුක්තයකු නම් එවැනි යම් මුදලක් ඔහුගේ සේවා නියුක්ති පාරිශ්‍රමිකයෙන් අයකර ගනු ලැබීමට හෝ අඩුකර ගනු ලැබීමට යටත් විය යුතු ය.

*තැනැත්තන් විසින් අධිකාරියට ගෙවීමට යටත් මුදල් එම තැනැත්තන්ගේ පාරිශ්‍රමික වලින් අයකර ගැනීම.*

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් අයකර ගැනීමේ ක්‍රමය යම් තැනැත්තකු සම්බන්ධයෙන් සතුටුදායක අයකර ගැනීමේ ක්‍රමයක් බවට සාමාන්‍යාධිකාරීවරයාගේ මතය වන්නේ නම් විධානයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහ යම් කාලාන්තරයන්හි දී ඒ තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකවලින් ඒ මුදල අඩුකර අධිකාරියට ගෙවන ලෙස ඒ තැනැත්තාගේ සේවායෝජකයාට ලිඛිතව විධාන කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ විධානයක් ලබන සෑම සේවා යෝජකයකු විසින් ම ඒ විධානය අනුව වහාම කටයුතු කළ යුතු ය.

(4) සේවා නියුක්ති පාරිශ්‍රමිකයෙන් එවැනි අඩු කිරීමක් කරන අවස්ථාවක, අයකර ගැනීම කරනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට අයකර ගැනීමේ දින සිට දින දහහතරකට වැඩි නොවන සාධාරණ කාලයක් ඇතුළත එම මුදල හෝ ඒ ලැබීම් ලැබුණු බවට සේවා යෝජකයා විසින් රිසිට් පතක් නිකුත් කළ යුතු අතර, ඒ රිසිට් පත නිකුත් කළ බව ඉහත සඳහන් විධානය තමා වෙත එවනු ලැබූ සාමාන්‍යාධිකාරීවරයාට ඒ කාලය ඇතුළත දී ම දැන්විය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙනුවෙන් කරනු ලැබූ විධානයක් බල පවත්වන අවස්ථාවක ඒ තැනැත්තා ඔහුගේ සේවායෝජකයාගේ සේවා නියුක්තිය හැර යෑමට ආසන්න හෝ හැර යන අවස්ථාවක සේවායෝජකයා විසින් වහාම—

(අ) ඒ තැනැත්තාට ලැබිය යුතු පාරිශ්‍රමිකය ඒ විධානය යටතේ අධිකාරියට ගෙවීමට යටත් මුදලට වඩා වැඩි වන්නේ නම් ඒ මුදල ඒ පාරිශ්‍රමිකයෙන් අඩුකර එසේ අඩු කරන ලද මුදල අධිකාරියට ගෙවිය යුතුය ; තවද

(ආ) ඒ පාරිශ්‍රමිකය අය කර ගනු ලැබිය යුතු මුදලට වඩා වැඩි නොවන්නේ නම් ඒ පාරිශ්‍රමික මුදල අධිකාරියට ගෙවිය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයක් පිළිපැදීමට යම් තැනැත්තකුගේ සේවායෝජකයකුට යම් හේතුවක් නිසා නොහැකි අවස්ථාවක, එසේ කිරීමට ඔහුට නොහැකි බව සහ නොහැකි වීමට හේතු ඔහු විසින් සාමාන්‍යාධිකාරීවරයාට වහාම ලිඛිතව දන්විය යුතු ය.

(7) මේ වගන්තියේ ඉහතින් වූ යම් විධිවිධානයක් කඩ කරන සෑම සේවායෝජකයකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් යම් වරදක් කරනු ලබන අවස්ථාවක—

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු; සහ

(ආ) පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, තමාගේ දැනුම නොමැතිව වරද කරනු ලැබූ බව හෝ එම වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු ඔප්පු කළහොත් එවැනි අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ හවුල්කරුවකු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු නොවේ.

(9) අධිකාරියේ අනුමතය ඇතිව මිස මේ වගන්තිය යටතේ වරදක් සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(10) මේ පනත යටතේ අධිකාරියට ගෙවීමට යටත් වූ සහ (2) වන උපවගන්තිය යටතේ සාමාන්‍යාධිකාරීවරයා විසින් ඒ සම්බන්ධයෙන් විධානයක් කරනු ලැබුවා වූ ද යම් මුදලක් වෙනත් යම් ආකාරයකින් හෝ ඒ වෙනුවෙන් අදාළ කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්ය පටිපාටියක් මගින් අයකර ගැනීමට සාමාන්‍යාධිකාරීවරයාට ඇති අයිතිය කෙරෙහි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් බල පෑමක් ඇති නොවිය යුතු ය ; නැතහොත් බලපෑමක් ඇත්තේ යයි සලකනු ලැබීම හෝ අදහස් කිරීම නොකළ යුතු ය.

අධිකාරිය වෙනුවෙන් සාමාන්‍යාධිකාරීවරයා විසින් ලේඛන අත්සන් කිරීම.

73. මේ පනත යටතේ අධිකාරිය විසින් තමා වෙත පවරනු ලැබූ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය කිරීමේ දී හෝ කාර්ය ඉටුකිරීමේ දී අත්සන් කරනු ලැබීමට හෝ ලියා අත්සන් කරනු ලැබීමට අවශ්‍යවන්නා වූ සියලු ලේඛන අධිකාරිය වෙනුවෙන් අත්සන් කිරීමට සහ ලියා අත්සන් කිරීමට සාමාන්‍යාධිකාරීවරයාට බලය දෙනු ලැබේ.

74. (1) අධිකාරියේ සෑම නිලධරයකු සහ සේවකයකු විසින් මේ පනත යටතේ තම ධුරයේ කටයුතු ආරම්භ කිරීමට පෙර හෝ ආරම්භ කිරීමේ දී හෝ ඉන් පසුව හෝ, අධිකාරියේ හෝ සාමාන්‍යාධිකාරිවරයාගේ සියලු කටයුතු සහ එම කටයුතුවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි ලෙස රහස්‍ය භාවය පිළිපැදීමට පොරොන්දුවෙමින් ප්‍රකාශනයක් අත්සන් කළ යුතුය. තවද, එම ප්‍රකාශනයෙන්— රහස්‍ය භාවය පිළිබඳ ප්‍රකාශනය.

(අ) සාමාන්‍යාධිකාරීවරයා විසින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට ; හෝ

(ආ) තම කාර්යය ඉටුකිරීමේ දී ; හෝ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධාන අනුව ක්‍රියා කිරීම පිණිස

හැර තම කාර්ය කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබිය හැකි යම් කාරණයක් හෙළි නො කිරීමට ඔහු පොරොන්දු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රහස්‍ය භාවය පිළිබඳ තම පොරොන්දුව උල්ලංඝනය කිරීමක් නොමැතිව ප්‍රශ්නයට පිළිතුරු දීමට ඔහුට නොහැකි නම් අධිකාරියේ කටයුතු පිළිබඳ යම් ප්‍රශ්නයකට පිළිතුරුදීමට අධිකාරියේ සෑම නිලධරයකු හෝ සේවකයකු විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශනය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පොරොන්දුව පිළිපැදීම පැහැර හරින සෑම නිලධරයකු හෝ සේවකයකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

75. (1) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් හා යුතුකම් ඉටු කිරීම පිළිබඳව සාමාන්‍ය හා විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට කළ හැකි අතර එවැනි විධාන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයාගේ විධාන.

(2) අධිකාරියේ දේපළ, ක්‍රියාකාරකම් සහ කටයුතු සම්බන්ධයෙන් යම් තොරතුරු තමා වෙත සපයන සේ අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කළ හැකි අතර එවැනි සෑම විධානයක්ම අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

76. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යමක් හෝ සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය:—

(අ) අධිකාරියේ කටයුතු පවත්වාගෙන යෑම හා කළමනාකාරිත්වය ;

(ආ) අධිකාරියේ ව්‍යාපාරික කටයුතු පාලනය කිරීම;

(ඇ) මේ පනත යටතේ අවශ්‍ය වන්නා වූ යම් කාරණා සඳහා නිකුත් කරනු ලැබිය යුතු ආකෘති;

(ඈ) මේ පනතින් නියම කරනු ලැබූ හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය පැවරුණු වෙනත් යම් කාරණයක්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කළ හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමේ බලය.

77. සාමාන්‍යාධිකාරීවරයා හෝ ඒ සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලිඛිතව බලය පවරනු ලැබූ යම් නිලධරයකු හෝ යම් සාධාරණ වේලාවක දී යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු වී, අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීමේ හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ හෝ, අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ කර්තව්‍යයක් කිරීමට හෝ කාර්යක් ඉටු කිරීමට, ආනුෂංගික වශයෙන් හෝ මූලික වශයෙන් අවශ්‍ය වන්නා වූ යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් කිරීමේ හෝ කාර්ය සඳහා සාධාරණ වශයෙන් අවශ්‍ය වන යම් ක්‍රියාවන්හි නිරතවීම නීත්‍යනුකූල විය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

78. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

79. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන පිට පවරනු ලබන නඩු සඳහා ආරක්ෂාව.

80. (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන යම් ක්‍රියාවක් සඳහා අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට තමා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන යම් ක්‍රියාවක් සඳහා අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධව

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරි යට ගෙනෙනු ලැබූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී දරන ලද යම් වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ මෙහෙයවීමෙන් හෝ කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන යම් ක්‍රියාවක් සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය අදහස් කරන්නේ නම් ඒ ක්‍රියාව සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව වූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගෙන නොමැති නම්, අධිකාරිය විසින් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු ය.

81. (1) මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සෑදිය හැකි ය. රීති සෑදීමට අධිකාරියට ඇති බලය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදනු ලැබූ කිසිම රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සෑදිය හැකි ය:—

(අ) අධිකාරිය විසින් ගිවිසුම්වලට ඇතුළු වනු ලැබිය හැකි ආකෘතිය සහ ආකාරය ;

(ආ) අධිකාරියේ නිලධරයන්ට සහ සේවකයන්ට බලතල පැවරීම ;

(ඇ) අධිකාරියේ ගිණුම් පවත්වා ගෙන යනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරය ;

(ඈ) අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පැවැත්ම හා විනය පාලනය ;

(ඉ) අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා කොන්දේසි සහ ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ;

(ඊ) අධිකාරියේ නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු ණය, දීමනා හෝ පාරිතෝෂික දීම ;

(ද) අධිකාරියේ නිලධරයන්ට සහ සේවකයන්ට නිවාස පහසුකම් සැලසීම ; සහ

(ධ) අධිකාරියේ නිලධරයන්ට සහ සේවකයන්ට වෘත්තීය සහ කාර්මික පුහුණුව සැලසීම.

ඇතැම් පනත් අධිකාරියට අදාළ කළ නොහැකි බව.

82. මෙහි උපලේඛනයෙන් දක්වා ඇති පනත්වල විධිවිධාන අධිකාරියේ යම් දේපළක්, කටයුත්තක් සහ යම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

වැරදි.

83. මේ පනතේ හෝ එය යටතේ සාදනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් ලිඛිත අනුනීතියක යම් විධිවිධාන කඩ කරන්නා වූ හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

84. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සභාපතිවරයා" යන්නෙන් අධිකාරියේ සභාපතිවරයා අදහස් වන අතර එම සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කරන යම් සාමාජිකයෙක් අදහස් වේ ;

"සාමාන්‍යාධිකාරීවරයා" යන්නෙන් අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා අදහස් වේ.

## උපලේඛනය

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත.

(268 වන අධිකාරය) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත.

1970 අංක 28 දරන කුලී නිවැසියන් (ආරක්ෂා කිරීමේ විශේෂ විධිවිධාන) පනත.

1972 අංක 7 දරන ගෙවල් කුලී පනත.